2022.10.13 දින පැවති මාසික සභා රැස්වීම

**ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතාගේ ප්‍රධානත්වයෙන්**
**2022.10.13 දින පෙ.ව.09:30 ට දොම්පෙ ප්‍රාදේශීය සභාවේ කිරිදිවැල සභා රැස්වීම් ශාලාවේදී පැවති දොම්පෙ ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීම් වාර්තාව.**

පැමිණීම:-

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ :-

| | | |
|---|---|---|
| 01. | පියසේන කාරියප්පෙරුම මහතා | ගරු සභාපති |
| 02. | අජිත් සිසිර කුමාර මහතා | ගරු උපසභාපති |
| 03. | ජේ.ඒ.සනී ජයවර්ධන මහතා | ගරු මන්ත්‍රී |
| 04. | ගාමිණී නිහාල් විජේරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 05. | ප්‍රියන්ත දීපාල් රංජන්දේව මහතා | ගරු මන්ත්‍රී |
| 06. | වයි.ඒ.සරත් ගාමිණී මහතා | ගරු මන්ත්‍රී |
| 07. | තාරක අබේවික්‍රම මහතා | ගරු මන්ත්‍රී |
| 08. | බී.එස්.අයි. දයාසුන්දර මහතා | ගරු මන්ත්‍රී |
| 09. | චන්දන කැළුම් ප්‍රියදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එස්.එම්.රාජා ලක්ෂ්මන් මහතා | ගරු මන්ත්‍රී |
| 11. | නදීකා සඳරුවනි තෙන්නකෝන් මිය | ගරු මන්ත්‍රිනී |
| 12. | ජගත් සිරිලාල් අතුකෝරල මහතා | ගරු මන්ත්‍රී |
| 13. | කේ.ඒ. කරුණාජීව මහතා | ගරු මන්ත්‍රී |
| 14. | දනුෂ්ක සාලින්ද දේශප්‍රිය මහතා | ගරු මන්ත්‍රී |
| 15 | එස්.එම්.රත්නසිරිලාල් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | උපාලි නිශාන්ත අනුරජිත් මහතා | ගරු මන්ත්‍රී |
| 17. | ඩබ්ලිව්. සුදර්මී මිය | ගරු මන්ත්‍රිනී |
| 18. | චිත්‍රානන්ද ජයවීර මහතා | ගරු මන්ත්‍රී |
| 19. | ලෙස්ලි ගුණරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 20. | දුමාල් මධුසංක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | ජානක පුෂ්ප කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 22 | අජන්ත රෝහිණී මිය | ගරු මන්ත්‍රී |
| 23 | ලලිත් වසන්ත පීරිස් මහතා | ගරු මන්ත්‍රී |
| 24. | ඩබ්.පී.ගංගා කුමාරි ජයවර්ධන මිය | ගරු මන්ත්‍රිනී |
| 25 | ඩබ්.එල්. ඤානවතී මිය | ගරු මන්ත්‍රිනී |

එක්සත් ජාතික පක්ෂය:-

| | | |
|---|---|---|
| 01. | උභය කුමාර ජයවර්ධන මහතා | ගරු විපක්ෂනායක |
| 02. | පුෂ්ප කුමාර රත්නායක මහතා | ගරු මන්ත්‍රී |
| 03. | මලින්ද ගුණරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 04. | එස්.ඒ.ඩී.වික්‍රමරත්න මිය | ගරු මන්ත්‍රිනී |
| 05. | නීල් ද ඩග්ලස් සමරකෝන් මහතා | ගරු මන්ත්‍රී |
| 06. | දමිත් ප්‍රියශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 07. | එස්.ඒ. පද්මිණී සමරසේකර මිය | ගරු මන්ත්‍රිනී |
| 08. | සමීර මාගම්මන මහතා | ගරු මන්ත්‍රී |
| 09. | නදීකා ප්‍රියංගනී මිය | ගරු මන්ත්‍රී |
| 10. | රුවනි දමයන්ති තිසේරා මිය | ගරු මන්ත්‍රිනී |
| 11. | එල්.ඒ.මධුර සංජීව අතුකෝරල මහතා | ගරු මන්ත්‍රී |

ජනතා විමුක්ති පෙරමුණ :-

| | | |
|---|---|---|
| 01. | දිමුතු ප්‍රදීප් පල්ලෙවෙල මහතා | ගරු මන්ත්‍රී |

ශ්‍රීලංකා නිදහස් පක්ෂය :-

| | | |
|---|---|---|
| 01. | ආර්.ජී.එම්.බී.අමින්ද රෝහිත මහතා | ගරු මන්ත්‍රී |
| 02. | බී.එල්.රාජු ආනල්ඩ් බුත්පිටිය මහතා | ගරු මන්ත්‍රී |

**2022.10.13 දින පැවති මාසික සභා රැස්වීම**

<u>සභාවට නොපැමිණි ගරු මන්ත්‍රීවරුන් ඃ-</u>

| | | |
|---|---|---|
| 01. | ප්‍රසාදිනී රේණුකා කාරියවසම් මිය | ගරු මන්ත්‍රිනී |
| 02. | කුමාර සෝමසිංහ මහතා | ගරු මන්ත්‍රී |
| 03. | ඩී. සමන්ත රංජන් මහතා | ගරු මන්ත්‍රී |
| 04. | ධම්මිකා මානෙල් රාමනායන මිය | ගරු මන්ත්‍රිනී |

(අ) පසුගිය සභා රැස්වීම් වාර්තා සභා සම්මත කිරීම

1. 2022.09.13. දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

<u>ගරු සභාපතිතුමා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු මන්ත්‍රීවරුනි, දොම්පෙ ප්‍රාදේශිය සභාවේ ගරු මන්ත්‍රී චන්ද්‍රකුමාර සෝමසිංහ මහතා 2022.09.13 දින පැවැත්වෙන ගරු සභාවට නොපැමිණෙන බව දුරකථනයෙන් දැනුම් දීම නිසා නිවාඩු අනුමත කළද එම මන්ත්‍රීතුමා එදින රක්ෂිත බන්ධනාගාරගතව සිටි නිසා එතුමාගේ නිවාඩුව අවලංගු කළයුතු බැවින් එය එලෙස සංශෝධනය කරනු ලබනවා.

<u>ගරු මන්ත්‍රී වයි.ඒ.සරත් ගාමිණී මහතා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, 2022.09.13 දින දොම්පෙ ප්‍රාදේශිය සභාවේ පැවති මාසික සභා රැස්වීම් වාර්තාව ඉහත සංශෝධන වලට යටත්ව සභාව පිළිගැනීම සුදුසු බව මම යෝජනා කරනවා.

එම යෝජනාව ගරු මන්ත්‍රී සාලින්ද දේශප්‍රිය මහතා විසින් ස්ථිර කරන ලදී.

(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදන

1. 2023 වර්ෂය සඳහා ප්‍රාදේශිය සභාවේ අයවැය ලේඛනය සැකසීමේ කටයුතු මේ වනවිට සිදුවෙමින් පවතී. ඒ සඳහා අදහස් හා යෝජනා ලබා ගැනිම සඳහා වු රැස්වීම 2022.10.18 දින ප.ව.3.00 ට ප්‍රාදේශිය සභාවේ රැස්වීම් ශාලාවේදී පැවැත්වීමට කටයුතු යොදා ඇති බැවින් ඒ සඳහා සියළුදෙනාටම සහභාගි වන මෙන් දන්වා සිටින ලදී.

2. දොම්පෙ ප්‍රාදේශිය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මුල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) උපවගන්තිය ප්‍රකාර ජාතික විගණන කාර්යාලයේ ජ්‍යෂ්ඨ සහකාර විගණකාධිපති විසින් විගණකාධිපති සම්පිඩන වාර්තාව 2022 ජුලි මස 21 වන දිනැතිව එවා ඇති බව ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට දන්වා සිටින ලදී.

(ඇ) නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

01. ගරු මන්ත්‍රිනී ප්‍රසාදිනී රේණුකා කාරියවසම් මිය
02. ගරු මන්ත්‍රී කුමාර සෝමසිංහ මහතා
03. ගරු මන්ත්‍රී ඩී. සමන්ත රංජන් මහතා
04. ගරු මන්ත්‍රී ධම්මිකා මානෙල් රාමනායන මිය

ඉහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් සහ ගරු මන්ත්‍රීතුමියන් අසනිප නිසා අද දින සභා රැස්වීමට නොපැමිණෙන බව දන්වා ඇති හෙයින් එම අයහට නිවාඩු අනුමත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු මන්ත්‍රී දමිත් ප්‍රියශාන්ත මහතා විසින් ස්ථිර කිරීමෙන් ඒකමතිකව සභා සම්මත විය.

(ඈ) සංදේශ, පෙත්සම් ,පැමිණිලි ඉදිරිපත් කිරීම.

(ඉ) යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න

**2022.10.13 දින පැවති මාසික සභා රැස්වීම**

**-නැත -**

(ඊ) **යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ඊ) 1 . ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

**දොම්පෙ ප්‍රාදේශීය සභාව**
**2023 වර්ෂයට අදාලව වරිපනම් බදු පැනවීම**
**යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ 1 වන උප වගන්තිය යටතේ දොම්පෙ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අංක 1199 හා 2001-08-24 දිනැති ගැසට් පත්‍රය යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශ කර ඇති ප්‍රදේශය ඇතුලත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2022 වර්ෂය සඳහා වූ තක්සේරුව/ සත්‍යාක්ෂණය 2023 වර්ෂය සඳහා පිළිගැනීම කල යුතු බවටත් එකී තක්සේරුව මත 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 (1) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපල මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් පහත සඳහන් වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවට,

| | |
|---|---|
| වැකේ උප කාර්යාල බල ප්‍රදේශය | 9% |
| පූගොඩ උප කාර්යාල බල ප්‍රදේශය | 7% |
| දොම්පෙ උප කාර්යාල බල ප්‍රදේශය | 6% |
| කැරගල උප කාර්යාල බල ප්‍රදේශය | 4% |

තවද 2023 වර්ෂයෙහි පහත උප ලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් දෙවන තීරුවෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද දොම්පෙ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2023 ජනවාරි මස 31 දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් 10% ක වට්ටමක්ද, එකී උප ලේඛනයේ එක් එක් කාර්තුවෙහි තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාල වරිපනම් බදු මුදල දොම්පෙ සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවකට අදාල මුදලින් 5%ක වට්ටමක්ද දොම්පෙ ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බව යෝජනා කරමි.

**උප ලේඛනය**

| 1 | 11 | 111 |
|---|---|---|
| **කාර්තුව** | **ගෙවිය යුතු දිනය** | **5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය** |
| පළමු කාර්තුව | 2023.01.01 සිට 2023.03.31 දක්වා | 2023.01.31 |
| දෙවන කාර්තුව | 2023.04.01 සිට 2023.06.30 දක්වා | 2023.04.30 |
| තෙවන කාර්තුව | 2023.07.01 සිට 2023.09.30 දක්වා | 2023.07.31 |
| හතරවන කාර්තුව | 2023.10.01 සිට 2023.12.31 දක්වා | 2023.10.31 |

**එම යෝජනාව ගරු මන්ත්‍රී සරත් ගාමිණී මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

ඊ) 2 . ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-

**දොම්පෙ ප්‍රාදේශීය සභාව**
**2023 වර්ෂයට අදාලව බලපත්‍ර ගාස්තු පැනවීම**
**යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය හා 149වන වගන්තිය යටතේ දොම්පෙ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අංක 1947/6 දරණ 2015.12.28 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය සහ අංක 1976/21 දරණ 2016.07.20 දිනැති අතුරු ව්‍යවස්ථාවේ විස්තර කර ඇති අති විශේෂ ගැසට් පත්‍රයට අනුව වෙළද බලපත්‍ර පිලිබද අතුරු ව්‍යවස්ථාවල විස්තර කර ඇති මෙහි පහත උප ලේඛන වල 1 වන තීරුවෙන් නිරූපිත යම් කාර්යයක් සඳහා දොම්පෙ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2023 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උප ලේඛන වල 11 තීරුවේ අනුරූප සටහනේ නිරූපිත වාර්ෂික වටිනාකම මත බලපත්‍ර ගාස්තුවක් 2023 වර්ෂය සඳහා නියම විය යුතු බවටද ,තවද එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරණ සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සදහා එම හෝටලය,ආපන ශාලාව හෝ නවාතැන්පල ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තා වූද, අනුමත කර හෝ පිලිගත්තාවූද අවස්ථාවක එසේ කරනු ලැබූ ගාස්තුව ඒ ගාස්තුව අයකරනු ලැබූ අවුරුද්දට පෙරාතුවම වූ අවුරුද්දේ ඒ හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන්පලේ ආදායම අනුව විය යුතු අතර එම ආදායමේ 1%ක් නොඉක්මවිය යුතුය. ඒ හෝටලය ආපන ශාලාව හෝ නවාතැන්පල ක්‍රියාත්මක වන පළමුවන අවුරුද්ද වන අවස්ථාවක, ඒ ගාස්තුව ඒ ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුව තීරණය කොට අය කල කරනු ලැබිය යුතු අතර එම ගාස්තුව මාර්තු 31 දිනට පෙර ගෙවිය යුතු බවටත් යෝජනා කරමි.

උප ලේඛනය

**1 වන තීරුව** **11වන තීරුව**

**බලය දෙනු ලබන කාර්යය**

**පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම**

| | රු.750/- නොඉක්මවන අවස්ථාවක | රු.750/- ඉක්මවන එහෙත් රු.1500/- නොඉක්මවන අවස්ථාවක | රු.1500/- ඉක්මවන අවස්ථාවක |
|---|---|---|---|
| | රු. ශත | රු. ශත | රු. ශත |
| 01.බේකරියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 02.හෝටල් හා පොදු ලැගුම්හල් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 03.මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 04.මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 05.භෝජනාගාරයක් පත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 06.අවමංගල සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙනස යාම | 500.00 | 750.00 | 1000.00 |

**පළමුවන උප ලේඛනය**

**පීඩාකාරී ව්‍යාපාර**

**1 වන තීරුව** **11වන තීරුව**

**බලය දෙනු ලබන කාර්යය** **පරිශ්‍රයේ**

**වාර්ෂික වටිනාකම**

| | රු.750/- නොඉක්මවන අවස්ථාවක | රු.750/- ඉක්මවන එහෙත් රු.1500/- නොඉක්මවන අවස්ථාවක | රු.1500/- ඉක්මවන අවස්ථාවක |
|---|---|---|---|
| | රු. ශත | රු. ශත | රු. ශත |
| 01.පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |
| 02.සම් පදම් කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 03.සම් විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 04. සත්ව පාලනය ( මස් කිරි හෝ බිත්තර සඳහා) | 500.00 | 750.00 | 1000.00 |
| 05.ඡායාරූප ශාලාවක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 06.පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 07.විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 08.කරවල ,ලුණු මාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |
| 09.පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |
| 10.දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 11.සත්ව ආහාර නිපදවීම හෝ සත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 12.පුන්නක්කු නිපදවීම හෝ කිලෝ ග්‍රෑම් 200ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 13.සබන් නිෂ්පාදනය කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 14.සත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |
| 15.අලුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |
| 16.ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 17.ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |
| 18.වේවැල් භාණ්ඩ නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 19.වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 20.සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 21.රසකැවිලි නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 22.පොල්ලෙලි පෙගවීම හෝ පල් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 23.බුරුසු වර්ග නිපදවීම ( දත් බුරුසු හැර) | 500.00 | 750.00 | 1000.00 |
| 24.දත් බුරුසු නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 25.රා එකතු කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 26.විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 27.යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 28.පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර 100ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |
| 29.සෝඩා නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 30.සම් භාණ්ඩ නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 31.පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින් වල ඇසිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 32.මිරිස්, කෝපි,ධාන්‍ය වර්ග, මාංෂ භෝග, කුළුබඩු හෝ කිරිපිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |

| | | | |
|---|---|---|---|
| 33.ඉටිපන්දම් නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 34.කපුරු නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 35.ලියන තීන්ත හෝ අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 36.රෙදි සෝදන නිල් නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 37.ලාකඩ නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 38.සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 39.පාසල් රට හුණු නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 40.ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |
| 41.ටයර් නැවත පිරවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 42.ටයර් ටියුබ් වෝල්කනයිසින් කිරීමේ ස්ථානයක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 43.සිමෙන්ති කිලෝ ග්‍රෑම් 1000ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |
| 44.සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 45.ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 46.යන්ත්‍රාන්සාරයෙන් රෙදි විවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 47.පොහොර,හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම. | 500.00 | 750.00 | 1000.00 |
| 48.යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම.. | 500.00 | 750.00 | 1000.00 |
| 49.ධාන්‍ය හෝ මාංෂ භෝග කිලෝ ග්‍රෑම් 200ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |

## දෙවන උප ලේඛනය

**අන්තරාදායක ව්‍යාපාර :**

| | | | |
|---|---|---|---|
| 01.තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝ ග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |
| 02.මැසූ ඇඳුම් නිෂ්පාදනය. | 500.00 | 750.00 | 1000.00 |
| 03.මුද්‍රණාලයක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 04. කුකුළන් 100ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 05.එළුවන්, ඌරන් 10ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ කොටුවක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 06.ගඩොල් හෝ උළු ගබඩාකර තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |
| 07.දර ගබඩාවක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 08.කළුගල් කැඩීම හෝ කැණීම යනුත්‍රාන්සාරයෙන් හෝ අතින් | 500.00 | 750.00 | 1000.00 |
| 09.සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල් බීම බෝතල් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම.. | 500.00 | 750.00 | 1000.00 |
| 10.අයිස් ක්‍රීම් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 11.පොල්තෙල් නිෂ්පාදනය හෝලීටර් 300ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 12.ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 13.කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 14.පාවිච්චි කල ඇඳුම් ගබඩා කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 15.ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අළුත්වැඩියා කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 16.යන්ත්‍රාන්සාරයෙන් ලී ඉරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 17.යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හල් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 18.හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩාකර තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |

| | | | |
|---|---|---|---|
| 19.පා පැදි හෝ යතුරු පැදි අලුත් වැඩියා කිරීමේ වැඩපලක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 20.පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩා කර තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |
| 21.විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 22.ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරිම හෝ නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 23.පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 24.ශීත කල මස් හෝ මාළු ගබඩාකර තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |
| 25.දැව ගබඩා කිරීම. | 500.00 | 750.00 | 1000.00 |

## තෙවන උප ලේඛනය

**පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර :**

| | | | |
|---|---|---|---|
| 01.රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එනසාල් හෝ කෙඳි කිරීම.. | 500.00 | 750.00 | 1000.00 |
| 02.ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම. | 500.00 | 750.00 | 1000.00 |
| 03.රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම. | 500.00 | 750.00 | 1000.00 |
| 04. විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 05.හුණුගල් හෝ හිරිගල් පිලිස්සීම, සකස් කිරීම හෝ අලුහුණු ගබඩා කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 06.බැටරි විද්‍යුත් ආරෝපනය හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 07.මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 08.මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 09.වාත්තු මඩුවක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 10.බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 11.ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 12.ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 13.වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 14.ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 15.කිලෝ ග්‍රෑම් 150ට වැඩියෙන් තේ කුඩු ගබඩාකර තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |
| 16.වෑල්ඩින් සඳහා ස්ථානයක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 17.ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩපලක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 18.පැට්‍රෝල් , ඩීසල්,තෙල් හෝ වෙනත් යම් ඛනිජ වර්ගයක් ගබඩා කර ඇති ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 19.කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 20.වායු සමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 21.විදුලි කර්මාන්ත වැඩපලක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අළුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 22.කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |

**එම යෝජනාව ගරු මන්ත්‍රී සාලින්ද දේශප්‍රිය මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**ඊ) 3 . ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

**දොම්පෙ ප්‍රාදේශීය සභාව**

**2023 වර්ෂයට අදාලව සංචාරක වෙළඳාම සඳහා ගාස්තු පැනවීම .**

**යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය හා 149වන වගන්තිය යටතේ දොම්පෙ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අංක 1947/6 දරණ 2015.12.28 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය සහ අංක 1976/21 දරණ 2016.07.20 දිනැති අතුරු ව්‍යවස්ථාවේ විස්තර කර ඇති අති විශේෂ ගැසට් පත්‍රයට අනුව සංචාරක පිලිබඳ අතුරු ව්‍යවස්ථාවල විස්තර කර ඇති මෙහි පහත උප ලේඛන වල සඳහන් පරිදි 2023 වර්ෂයට ගාස්තු අය කිරීමට යෝජනා කරමි.

| කාලය | අය කරනුලබන මුදල |
|---|---|
| මාස 03ක කාලයක් සඳහා | 500.00 |
| මාස 06ක කාලයක් සඳහා | 750.00 |
| අවුරුද්දක කාලයක් සඳහා | 1000.00 |

**එම යෝජනාව ගරු මන්ත්‍රී චන්දන කැළුම් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදි.**

**ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**ඊ) 4 . ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

**දොම්පෙ ප්‍රාදේශීය සභාව**

**2023 වර්ෂයට අදාලව කර්මාන්ත බද්දක් පැනවීම .**

**යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ 1 වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව දොම්පෙ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උප ලේඛනයෙහි 1 වැනි තීරුවේ නිරූපිත යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උප ලේඛනයෙහි 11වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත යම් ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා මාර්තු 31 දිනට පෙර අය කල යුතු යැයි යෝජනා කරමි.

**උප ලේඛනය**

| **1 වන තීරුව** | **11වන තීරුව** | | |
|---|---|---|---|
| | **පරිශ්‍රයේ වාර්ෂික** | | |
| **වටිනාකම** | | | |
| **කර්මාන්තය** | **රු.750/- නොඉක්මවන අවස්ථාවක** | **රු.750/- ඉක්මවන රු.1500/- නොඉක්මවන අවස්ථාවක** | **රු.1500/- ඉක්මවන අවස්ථාවක** |
| | රු. ශත | රු. ශත | රු. ශත |
| 01.පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 02.මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 03.ඇඳුම් මසන ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |

| | | | |
|---|---|---|---|
| 04.ඉලෙක්ට්‍රොනික උපාංග සඳහා පරිපථ පුවරු නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 05.කැටයම් නිර්මාණය කිරීම හා විකිණීම. | 500.00 | 750.00 | 1000.00 |
| 06.කෘෂි උපකරණ නිෂ්පාදනය. | 500.00 | 750.00 | 1000.00 |
| 07.මිනී පෙට්ටි සාදන හෝ ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 08.රබර් ආශ්‍රිත නිෂ්පාදන. | 500.00 | 750.00 | 1000.00 |
| 09.වානේ ගෘහ භාණ්ඩ අමතර කොටස් නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 10.යකඩ නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 11.යකඩවලින් ගොඩනැගිලි සැකිලි සැකසීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 12.හඳුන්කූරු නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 13.කම්මලක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 14.අත්‍යන්ත්‍ර මාර්ගයෙන් රබර් දුම් ගැස්සවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 15.කොප්පරා නිපදවීම සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 16. රබර් ගම් බූට්ස් නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 17.කඩදාසි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 18.යන්ත්‍රානුසාරයෙන් සපත්තු හෝ පාවහන් නිපදවීම සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 19.පොලිතින් ආශ්‍රිත නිෂ්පාදන සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 20.අයිස් පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 21.පානීය ජලය බෝතල් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 22.ඔට්ටුපාලු අඹරන ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 23.බිම්මල් නිෂ්පාදනය. | 500.00 | 750.00 | 1000.00 |
| 24.කුළුබඩු පැකට් කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 25.පපඩම් නිෂ්පාදනය. | 500.00 | 750.00 | 1000.00 |
| 26.බයිට් පැකට් කිරීම. | 500.00 | 750.00 | 1000.00 |

**එම යෝජනාව ගරු මන්ත්‍රී ගාමිණී නිහාල් විජේරත්න මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**ඊ) 5 . ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

**දොම්පෙ ප්‍රාදේශීය සභාව**

**2023 වර්ෂය අදාලව ප්‍රචාරක දැන්වීම් ගාස්තු පැනවීම**

**යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වැනි වගන්තියෙන් දොම්පෙ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අංක 1947/6 හා 2015 දෙසැම්බර් මස 28 වන දිනැති, අංක 1976/21 දරණ 2016-07-20 දිනැති සහ අංක 1978/22 හා 2016.08.03 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පලකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ ප්‍රචාරක දැන්වීම් පිලිබඳ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව දොම්පෙ ප්‍රාදේශීය සභා සීමාව තුල යම් පරිශ්‍රයක පාරකට, ඇළකට, වැවකට, හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උප ලේඛනයේ සඳහන් අනුප්‍රමාණ අනුව වාර්ෂික ගාස්තුවක් 2023 වර්ෂය අයකල යුතුයැයි යෝජනා කරමි.

**උප ලේඛනය**

| | පුවරුවේ ස්වභාවය | වර්ග මීටර් ප්‍රමාණය | ගාස්තුව රුපියල් | | |
|---|---|---|---|---|---|
| | | | මාස 3 | මාස 3-6 අතර | වසරක් |
| 01 | කිසියම් බිත්තියක තාප්පයක ප්‍රචාරය කරනු ලබන දැන්වීම් | 1 ට අඩු | 250.00 | 350.00 | 500.00 |
| | | 1 ට වැඩි | 1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.200.00 බැගින් | | |
| 02 | රෙදි ඩිජිටල් බැනර් සඳහා | 3 ට අඩු | 250.00 | 350.00 | 500.00 |
| | | 3 ට වැඩි | 3ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.200.00 බැගින් | | |
| 03 | තහඩු හෝ දැව මගින් ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 1 ට අඩු | 500.00 | 750.00 | 1000.00 |
| | | 1 ට වැඩි | 1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.300.00 බැගින් | | |
| 04 | විදුලිය යොදාගෙන ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 1 ට අඩු | 500.00 | 750.00 | 1000.00 |
| | | 1 ට වැඩි | 1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.300.00 බැගින් | | |
| 05 | ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 1 ට අඩු | 250.00 | 350.00 | 500.00 |
| | | 1 ට වැඩි | 1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.200.00 බැගින් | | |
| 06 | ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 1 ට අඩු | 250.00 | 350.00 | 500.00 |
| | | 1 ට වැඩි | 1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.200.00 බැගින් | | |
| 07 | විද්‍යුත් උපකරන යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 1 ට අඩු | 750.00 | 850.00 | 1000.00 |
| | | 1 ට වැඩි | 1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු.500.00 බැගින් | | |

**එම යෝජනාව ගරු මන්ත්‍රී ජගත් අතුකෝරල මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**ඊ) 6. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

**දොම්පෙ ප්‍රාදේශීය සභාව**

**2023 වර්ෂයට අදාලව ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥා පනත යටතේ බලපත්‍ර ගාස්තු පැනවීම යෝජනාව**

ප්‍රසිද්ධ රග දැක්වීම් ආඥා පනත යටතේ 176 වැනි අධිකාරිය 3 වැනි වගන්තිය ප්‍රකාරව දොම්පෙ ප්රාදේශීය සභා බල ප්‍රදේශය තුල පවත්වනු ලබන සියලුම නාට්‍ය , චිත්‍රපට දර්ශන, සංගීත සංදර්ශන , සර්කස් දර්ශන හා විවිධ දර්ශන සඳහා මෙහි පහත උප ලේඛනයේ දැක්වෙන බලපත්‍ර ගාස්තු 2023 වර්ෂය තුල පනවා අයකල යුතුයැයි යෝජනා කරමි.

| උප ලේඛනය | රු. ශත |
|---|---|
| 1. දින එකකට හෝ දින තුන නොඉක්මවන විට | 500.00 |
| 2. දින තුන ඉක්මවන සෑම දිනයකටම හෝ ඉන් කොටසකට (රු.500ට අමතරව) | 100.00 |

**එම යෝජනාව ගරු මන්ත්‍රී ප්‍රියන්ත දීපාල් රංජන්දේව මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකගතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**ඊ) 7 . ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

**දොම්පෙ ප්‍රාදේශීය සභාව**
**2023 වර්ෂයට අදාලව වාහන හා සතුන් පිලිබද බදු පැනවීම**
**යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය යටතේ දොම්පෙ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂයේ පහත උප ලේඛනයේ සදහන් පරිදි වාහනයක් හෝ සතකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකුගෙන්ම 2023 වර්ෂය සදහා බද්දක් පනවා අයකල යුතු බවට යෝජනා කරමි.

**උප ලේඛනය**

**රු. ශත**

1. මෝටර් රථයක් ,ට්‍රයිසිකලයක්, මෝටර් ලොරියක්,මෝටර් බයිසිකලයක්,
   25.00
   කරත්තයක්,ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන
   සෑම වාහනයක් සදහා
2. සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සදහා
   (අ)වෙළද කාර්යයක් සදහා යොදවන්නේ නම්
   18.00
   (ආ) වෙළද කාර්යයක් නොවන කාර්යයක් සදහා යොදවන්නේ නම්
   4.00
3. සෑම කරත්තයක් සදහා 20.00
4. සෑම අත් කරත්තයක් සදහා
   10.00
5. සෑම රික්ෂෝවක් සදහා 7.50
6. සෑම අශ්වයෙකු, පෝනියක් හෝ කොටළුවක් සදහා 15.00
7. සෑම ඇතෙකු සදහා
   50.00

විශ්කම්භය අගල් 26 නොඉක්මවන රෝද සහිත සහිත ළමා වාහන , විල්බැරෝ හුදෙක් පුද්ගලික ස්ථානවලදී පමණක් වෙළද කාර්යයන් සදහා යොදවන අත් කරත්ත හෝ වෙළද කාර්යයන් නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.
මේ ලේඛනයේ ‘‘වෙළද කාර්යය’’ යන්නට විකිණීම හෝ අනාාකාරයෙන් හෝ යම් වෙළද ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සදහා වූ යම් ද්‍රව්‍යයක් හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුලත් වේ.

**එම යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ.සනී ජයවර්ධන මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**ඊ) 8 . ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

**දොම්පෙ ප්‍රාදේශීය සභාව**

**2023 වර්ෂයට අදාලව ව්‍යාපාර බදු පැනවීම**

**යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ 1වන උප වගන්තිය යටතේ දොම්පෙ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ යම් බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් දොම්පෙ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත 2023 වර්ෂයේදී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරය 2022 වර්ෂයේ මෙහි පහත සදහන් උප ලේඛනයෙහි 1 වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුලත පවතින අවස්ථාවක එකී 11වන තීරුවෙහි අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2023 වර්ෂය සඳහා පනවා මාර්තු 31 දිනට පෙර අයකල යුතු බවට යෝජනා කරමි.

**උප ලේඛනය**

| **1** වන තීරුව | **11**වන තීරුව |
|---|---|
| 2021 වර්ෂයේදී ව්‍යාපාරයේ ආදායම | රු. ශත |
| රු.6000 නොඉක්මවන අවස්ථාවක | කිසිවක් නැත |
| රු.6000 ඉක්මවන එහෙත් රු.12000 නොඉක්මවන අවස්ථාවක | 90.00 |
| රු.12000 ඉක්මවන එහෙත් රු.18750 නොඉක්මවන අවස්ථාවක | 180.00 |
| රු.18750 ඉක්මවන එහෙත් රු.75000 නොඉක්මවන අවස්ථාවක | 360.00 |
| රු.75000 ඉක්මවන එහෙත් රු.150000 නොඉක්මවන අවස්ථාවක | 1200.00 |
| රු.150000 ඉක්මවන අවස්ථාවක | 3000.00 |

**එම යෝජනාව ගරු මන්ත්‍රී නිශාන්ත අනුරජිත් වෙඩිසිංහ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**ඊ) 9 . ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

**දොම්පෙ ප්‍රාදේශීය සභාව**

**2023 වර්ෂයට අදාලව ඇතැම් ඉඩම් විකිණීම් මත බදු අය කිරීම**

**යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 154 වැනි වගන්තියේ 1වන උප වගන්තිය යටතේ දොම්පෙ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දොම්පෙ ප්‍රාදේශීය සභාවේ පාලන සීමාව තුල තිබෙන යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ ඔහුගේ සේවකයකු හෝ නියෝජිතයෙක් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1%

සමාන බද්දක් විකුණුම්කරු හෝ අනුගාමිකයා විසින් දොම්පෙ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යැයි යෝජනා කරමි.

**එම යෝජනාව ගරු මන්ත්‍රී ජගත් අතුකෝරල මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකගතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**ඊ) 10.. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

**දොම්පෙ ප්‍රාදේශීය සභාව**
**2023 වර්ෂයට අදාලව ක්‍රීඩා භූමි පරිහරණය කිරීමට අය කරන ගාස්තු අය කිරීම**
**යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වැනි වගන්තිය යටතේ දොම්පෙ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අංක 1947/6 හා 2015 දෙසැම්බර් මස 28 වන දින සහ අංක 1976/21 දරණ 2016.07.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පලකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ ක්‍රීඩා භූමි පිලිබද අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව දොම්පෙ ප්‍රාදේශීය සභාවට අයිති පහත උප ලේඛනයේ සදහන් පරිදි ක්‍රීඩා භූමි සදහා ගාස්තුවක් 2023 වර්ෂය සදහා පනවා අයකල යුතු බවට යෝජනා කරමි.

**උප ලේඛනය**
**ක්‍රීඩා භූමි පරිහරණය කිරීමට අය කරන ගාස්තු**

| ක්‍රීඩා භූමියේ නම | ගාස්තුව දිනකට රු. ශත | තැන්පත් මුදල රු. ශත |
|---|---|---|
| 01.මාළිගාවත්ත ක්‍රීඩාංගනය | | |
| පාසැල් ක්‍රීඩා තරග | 2500.00 | 0.00 |
| බල ප්‍රදේශයේ ලියාපදිංචි ක්‍රීඩා සමාජ | 3000.00 | 2000.00 |
| ව්‍යාපාරික නොවන | 5000.00 | 5000.00 |
| ව්‍යාපාරික විවිධ ප්‍රසංග | 20000.00 | 20000.00 |
| 01.1. බල ප්‍රදේශයේ පාසල් සදහා ආධාර පිණිස පවත්වන ප්‍රසංග | 10000.00 | 10000.00 |
| 02. කිරිදිවැල මහජන ක්‍රීඩාංගනය | | |
| පාසැල් ක්‍රීඩා තරග | 2500.00 | 0.00 |
| ව්‍යාපාරික විවිධ ප්‍රසංග | 20000.00 | 20000.00 |
| 02.1. බල ප්‍රදේශයේ පාසල් සදහා ආධාර පිණිස පවත්වන ප්‍රසංග | 10000.00 | 10000.00 |
| 03.වානළුවාව ක්‍රීඩාංගනය | | |
| පාසැල් ක්‍රීඩා තරග | 2000.00 | 0.00 |
| බල ප්‍රදේශයේ ලියාපදිංචි ක්‍රීඩා සමාජ | 2500.00 | 0.00 |
| ව්‍යාපාරික නොවන | 3000.00 | 0.00 |
| ව්‍යාපාරික විවිධ ප්‍රසංග | 7500.00 | 1000.00 |

සැ.යු සියලු ගාස්තු වලට රජයේ බදු මුදල් අය කෙරේ.
තාක්ෂණ නිලධාරි වාර්ථා අනුව තැන්පත් මුදල නිදහස් කෙරේ.

**එම යෝජනාව ගරු මන්ත්‍රී සරත් ගාමිණි මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකගතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**ඊ) 11 . ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

**දොම්පෙ ප්‍රාදේශීය සභාව**

**2023 වර්ෂයට අදාලව සේවා ගාස්තු අය කිරීම.**

**යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වැනි වගන්තිය යටතේ දොම්පෙ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අංක 1947/6 දරන 2015 දෙසැම්බර් මස 28 වන දිනැති හා 1976/21 දරණ 2016.07.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පලකර ඇති සේවා සදහා ගාස්තු අය කිරීම පිලිබද අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව දොම්පෙ ප්‍රාදේශීය සභාව පහත උප ලේඛනයේ සදහන් පරිදි සේවා සදහා ගාස්තු 2023 වර්ෂය සදහා පනවා අයකල යුතු බවට යෝජනා කරමි.

**උප ලේඛනය**

| **ඉල්ලුම් පත්‍රය** | **ගාස්තුව**<br>**රු. ශත** |
|---|---|
| 1. සභාව විසින් පවත්වාගෙන යනු ලබන පුස්තකාල සාමාජිකයන් සදහා ඇතුල්වීමේ ඉල්ලුම් පත්‍රය | 50.00 |
| 2.වරිපනම් ලේඛනයේ උද්‍ධෘත ලබා ගැනීම සදහා ඉල්ලුම් පත්‍රය | 100.00 |
| 3.වීථි රේඛා හා නොපරවා ගැනීමේ සහතිකයක් ලබා ගැනීමේ ඉල්ලුම් පත්‍රය | 100.00 |

| **සහතික පත්‍රය** | **ගාස්තුව**<br>**රු. ශත** |
|---|---|
| 1. වීථි රේඛා හා නොපරවා ගැනීමේ සහතිකයක් ලබා ගැනීම සදහා සහතික පත්‍රය | 500.00 |
| 2. වරිපනම් ලේඛන ආශ්‍රයෙන් හිමිකම් පිලිබද සහතික පත්‍රය | 500.00 |
| 3.වරිපනම් ලේඛනයේ උද්‍ධෘත සනාථ කරන සහතික පත්‍රය | 500.00 |
| 4.නිකුත් කරන ලද තක්සේරු නිවේදන සනාථ කරන සහතික පත්‍රය | 500.00 |

සැ.යු සියලු ගාස්තු වලට රජයේ බදු මුදල් අය කෙරේ.

**එම යෝජනාව ගරු මන්ත්‍රී ජානක පුෂ්ප කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකගතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**ඊ) 12 . ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

**දොම්පෙ ප්‍රාදේශීය සභාව**

**2023 වර්ෂයට අදාලව සැරසිලි විධිමත් කිරීම සදහා ගාස්තු අය කිරීම .**

**යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වැනි වගන්තිය යටතේ දොම්පෙ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අංක 1947/6 දරණ 2015 දෙසැම්බර් මස 28 වන දින හා අංක 1976/21 දරණ 2016-07-20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පලකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ සැරසිලි විධිමත් කිරීම පිලිබඳ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව දොම්පෙ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පහත උප ලේඛනයේ සදහන් පරිදි සැරසිලි විධිමත් කිරීම සදහා ගාස්තු 2023 වර්ෂය සදහා පනවා අයකල යුතු බවට යෝජනා කරමි.

**උප ලේඛනය**

1.සැරසිලි සදහා ගාස්තුව

රු. ශත

වර්ග මීටර 500 දක්වා

රු.3000.00

වැඩිවන සෑම වර්ග මීටරයක් සදහා රු.300 බැගින් අය කෙරේ.

( සැරසිලි කර පැය 24ක් තුල ඉවත් නොකරන්නේ නම් ඒ සදහා ශ්‍රමික ගාස්තු වශයෙන් දිනකට රු.1000.00)

**එම යෝජනාව ගරු මන්ත්‍රී එස්.එම්.රත්නසිරිලාල් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකගතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**ඊ) 13 . ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

**දොම්පෙ ප්‍රාදේශීය සභාව**

**2023 වර්ෂයට අදාලව ඉල්ලුම්පත් හා සේවා සදහා ගාස්තු අය කිරීම**

**යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ දොම්පෙ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නිකුත් කරන ලද ඉල්ලුම්පත් සේවා සහ සභාවට අයිති වත්කම් කුළියට දීම හා මෙහි පහත සදහන් උප ලේඛනයේ සදහන් පරිදි ගාස්තු 2023 වර්ෂය සදහා පනවා අයකල යුතු බවට යෝජනා කරමි.

**උප ලේඛනය**

| | රු. ශත |
|---|---|
| 1.ආදාහනාගාර ගාස්තු | |
| බල ප්‍රදේශය තුල | 8000.00 |
| බල ප්‍රදේශයෙන් පිටත | 12000.00 |
| 2.සුසාන භූමි ගාස්තු අය කිරීම වර්ග අඩියකට (අවම වර්ගඅඩි 18 ක් වියයුතුයි) (තැන්පත් කිරීම හෝ ස්මාරක ඉදි කිරීම) | 1000.00 |
| 3.ප්‍රජා ශාලා ගාස්තු අය කිරීම - **දොම්පෙ** ප්‍රජා ශාලාව ( දිනකට) | |
| ව්‍යාපාරික නොවන (ආපසු ගෙවන ලබන තැන්පත් මුදල සදහා රු.2000/-) | 4000.00 |
| ව්‍යාපාරික (ආපසු ගෙවන ලබන තැන්පත් මුදල සදහා රු.5000/-) | 8000.00 |
| 4.පුස්තකාල සාමාජික ගාස්තු (අවු.5ට වැඩි) | 100.00 |

5.පුස්තකාල ප්‍රමාද ගාස්තු දිනකට
ළමා 1.00
වැඩිහිටි 2.00

6.පෙර පාසැල් ලියා පදිංචි ගාස්තු 100.00

7.පෙර පාසැල සඳහා පහසුකම් හා සේවා ගාස්තු (එක් මසකට) 500.00

8.කිරිදිවැල ප්‍රාදේශීය සභා භූමිය තාවකාලිකව කුලියට ලබා දීම ( දිනකට) 5000.00
(වර්ග අඩි 100ක් සඳහා)

9.ඔප්පු සාරාංශ අයදුම්පත් 100.00

10.පරිසර බලපත්‍ර අයදුම්පත් 1000.00

11. පරිසර බලපත්‍ර අළුත් කිරීමේ අයදුම්පත් 1000.00

12.පස් ප්‍රවාහන අවසර පත්‍රයක් නිකුත් කිරීමේ අයදුම් පත්‍රය 1000.00

20.00
13.කොඩි කණුවක් කුලියට දීම (දිනකට)
(ආපසු ගෙවන තැන්පත් මුදල කොඩි කණුවක් සඳහා රු.100)

14.තල කම්පනය කුලියට ලබා දීම ඉන්ධන රහිතව ක්‍රියාකරු සමග දිනකට 3500.00

15.ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන වෙනත් සහතිකයක් වෙනුවෙන් අය කරන ගාස්තු 1000.00

16.සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු 1000.00
17.ගලි බවුසරය සඳහා ගාස්තු අය කිරීම
ව්‍යාපාරික නොවන ( සභා බල ප්‍රදේශය තුල) 3500.00
ව්‍යාපාරික නොවන ( සභා බල ප්‍රදේශයෙන් පිටත) 5000.00
ව්‍යාපාරික ( සභා බල ප්‍රදේශය තුල) 6000.00
ව්‍යාපාරික ( සභා බල ප්‍රදේශයෙන් පිටත) 7500.00
( දුර ප්‍රමාණය අනුව යාම සහ ඒ ම වෙනුවෙන් කි.මී 1ට රු.125/- බැගින් ප්‍රවාහන ගාස්තුවක් අය කෙරේ)

18.මෝටර් ග්‍රේඩරය මීටර් පැය 1ක් සඳහා ගාස්තුව (ඉන්ධන රහිතව)
සභා ගිවිසුම් ගත කර්මාන්ත සඳහා 3500.00
අනෙකුත් කර්මාන්ත සඳහා 5000.00

(අවම පැය 3ක් විය යුතුයි)

19. JCB යන්ත්‍රය මීටර් පැය 1ක් සඳහා ගාස්තුව (ඉන්ධන රහිතව)
සභා ගිවිසුම් ගත කර්මාන්ත සඳහා 3500.00
අනෙකුත් කර්මාන්ත සඳහා 4500.00

( දුර ප්‍රමාණය අනුව කි.මී 1ට රු.125/- බැගින් ප්‍රවාහන ගාස්තුවක් අය කෙරේ)

| | |
|---|---|
| 20.ලොකු මාර්ග තලනය ( දිනකට) (ඉන්ධන රහිතව) | 14000.00 |
| 21.කුඩා මාර්ග තලනය (දිනකට) (ඉන්ධන රහිතව) | 5000.00 |
| 22.මාර්ග පලුදු කිරීම | |
| කාපට් මාර්ගය සඳහා වර්ග මීටරයකට | 12000.00 |
| තාර ඇතිරූ මාර්ගයක් සඳහා වර්ග මීටරයකට | 7500.00 |
| කොන්ක්‍රීට් මාර්ගයක් සඳහා වර්ග මීටරයකට | 7000.00 |
| බොරලු මාර්ගයක් සඳහා වර්ග මීටරයකට | 1500.00 |
| ඉන්ටලොග් ගල් ඇතිරූ මාර්ගයක් සඳහා වර්ග මීටරයකට | 5000.00 |
| 23.කියුබ් 01 ටිපර් රථය (පැය 8ක් සඳහා ඉන්ධන හා රියදුරු සමග) | 12000.00 |

24. උත්සව සහ ප්‍රසංග සඳහා ආලෝකඋපකරණ /ශබ්ද වාහිනී උපකරණ / මාධ්‍ය උපකරණ

කුලියට දීමේදී අයකරනු ලබන ගාස්තු

| | |
|---|---|
| සාමාන්‍ය උත්සව සඳහා | |
| ශබ්ද වාහිනි යන්ත්‍ර (වරුවක් සඳහා) | 5000.00 |
| ශබ්ද වාහිනි යන්ත්‍ර ( දිනක් සඳහා ) | 8000.00 |
| ආලෝක පහන් සමග ශබ්දවාහිනී යන්ත්‍ර (වරුවක් සඳහා) | 6500.00 |
| ආලෝක පහන් සමග ශබ්දවාහිනී යන්ත්‍ර (දිනක් සඳහා) | 9000.00 |
| විවාහ උත්සව සඳහා | |
| ශබ්ද වාහිනි යන්ත්‍ර (වරුවක් සඳහා ) | 6000.00 |
| ශබ්ද වාහිනි යන්ත්‍ර ( දිනක් සඳහා ) | 8500.00 |
| ක්‍රීඩා තරග සඳහා දිනකට ශබ්දවාහිනී යන්ත්‍ර | 3500.00 |
| DJ වරුවක් සඳහා | 7700.00 |
| DJ දිනක් සඳහා | 11000.00 |
| පැය 1-2 වැඩ සටහන් සඳහා (මොනිටර්ස් ) | 3000.00 |
| වීඩියෝකැමරාව දිනකට | 7000.00 |
| ඡායාරූපකරණය සඳහා කැමරාව දිනකට | 5000.00 |

FM මයික්‍රපෝන 2ට වඩා වැඩිවන සෑම අවස්ථාවකම මයික්‍රපෝන යුගලක් සඳහා රු.1000/-බැගින් අය කිරීම.

වරුවක් ලෙස පැය 06ක කාලයක් දැක්වෙන අතර වැඩිවන සෑම පැයකටම රු.1000/-ක් අය කිරීම.

වැඩිවන විදුලි පහන් යුගලක් සඳහා රු.5000/-ක් අය කිරීම.

ප්‍රධාන කාර්යාලයේ සිට කි.මී 10ක දුරක් හා ආසනය තුල ප්‍රවාහනය නොමිලේ සිදු කරන අතර එම සීමාවෙන් පිටත කි.මී 1ක් සඳහා රු.125/- අය කෙරේ.

මෙම සියලු ගාස්තු සඳහා රජයේ අනුමත බදු මුදල් අය කෙරේ

එම යෝජනාව ගරු මන්ත්‍රිනි ඩබ්.සුධර්මී  මිය විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකගතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

ඊ) 14 . ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-

දොම්පෙ ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට අදාලව ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ රීති යටතේ ගාස්තු අය කිරීම .

යෝජනාව

1987 අංක 15දරණ ප්‍රාදේශීය සභා පනතේ 19වගන්තිය සහ 109වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සහ 2008 අංක 01 දරණ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ රීති යටතේ සාදා ඇති කසල එකතු කිරීම මත ගාස්තු දොම්පෙ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල 2023 වර්ෂයේ කසල බැහැර කිරීම වෙන්වෙන් පහත උප ලේඛනය යටතේ අය කිරීමට යෝජනා කරමි.

| අංකය | වර්ගය | අපද්‍රව්‍ය ජනනය අනුව වර්ගීකරණය | දිනකට අපද්‍රව්‍ය ප්‍රමාණය (kg) | මාසික ගාස්තුව (Rs) රජයේ බදු මුදල් එකතුවිය යුතුයි. |
|---|---|---|---|---|
| 01 | හෝටල් (දේශීය සහ විදේශීය) | | | |
| | | මහා පරිමාණ | >50 | 22,500-50,000 |
| | | මධ්‍ය පරිමාණ | 10-50 | 5,000-22,500 |
| | | කුඩා පරිමාණ | <10 | 1000-5,000 |
| | | | | |
| 02 | නේවාසිකාගාර/හෝටල් | | | |
| | | මහා පරිමාණ | >10 | 5,000-25,000 |
| | | මධ්‍ය පරිමාණ | 5-10 | 2500-5000 |
| | | කුඩා පරිමාණ | <5 | 500-2500 |
| 03 | අවන්හල් /ආහාර ලබාගනු ලබන ස්ථාන/උත්සව ශාලා | | | |
| | | මහා පරිමාණ | >50 | 22,500-50,000 |
| | | මධ්‍ය පරිමාණ | 10-50 | 5,000-22,500 |
| | | කුඩා පරිමාණ | <10 | 500-5,000 |
| | | | | |
| 04 | සුපිරි වෙළඳසැල් | | | |
| | | මහා පරිමාණ | >50 | 22,500-50,000 |
| | | මධ්‍ය පරිමාණ | 10-50 | 5,000-22,500 |
| | | කුඩා පරිමාණ | <10 | 1000-5,000 |
| | | | | |
| 05 | එළවළු /පලතුරු/මාළු/මස් වෙළඳසැල් | | | |
| | | මහා පරිමාණ | >10 | 5,000-25,000 |
| | | මධ්‍ය පරිමාණ | 5-10 | 2500-5000 |
| | | කුඩා පරිමාණ | <5 | 500-2500 |
| | | | | |
| 06 | කර්මාන්තශාලා (උපද්‍රවකාරී නොවන) | | | |

| | | | | |
|---|---|---|---|---|
| | | මහා පරිමාණ | >50 | 22,500-50,000 |
| | | මධ්‍ය පරිමාණ | 10-50 | 5,000-22,500 |
| | | කුඩා පරිමාණ | <10 | 1000-5,000 |
| 07 | පුද්ගලික රෝහල් ,සාත්තු නිවාස සහ බෙහෙත්ශාලා (ආසාදිත නොවන) | | | |
| | | මහා පරිමාණ | >30 | 20,000-50,000 |
| | | මධ්‍ය පරිමාණ | 15-30 | 10,000-20,000 |
| | | කුඩා පරිමාණ | <15 | 1,000-10,000 |
| | | | | |
| 08 | අනෙකුත් වාණිජ ආයතන (රාජ්‍ය /පුද්ගලික) | | | |
| | | මහා පරිමාණ | >30 | 15000-40000 |
| | | මධ්‍ය පරිමාණ | 10-30 | 5000-15000 |
| | | කුඩා පරිමාණ | <10 | 500-5000 |
| | | | | |
| 09 | සේවා සපයනු ලබන ආයතන (රාජ්‍ය /පුද්ගලික) | | | |
| | | මහා පරිමාණ | >10 | 5,000-25,000 |
| | | මධ්‍ය පරිමාණ | 5-10 | 2500-5000 |
| | | කුඩා පරිමාණ | <5 | 500-2500 |
| | | | | |
| 10 | ආගමික ස්ථාන | මහා පරිමාණ | >25 | 5,000-15,000 |
| | | මධ්‍ය පරිමාණ | 5-25 | 1000-5000 |
| | | කුඩා පරිමාණ | <5 | 500-1000 |

**එම යෝජනාව නිශාන්ත අනුරජිත් වෙඩිසිංහ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**ඊ) 15 . ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

**දොම්පෙ ප්‍රාදේශීය සභාව**

**2023 වර්ෂයට අදාලව කර්මාන්ත ශාලා වලින් කසල බැහැර කිරීම වෙනුවෙන් ගාස්තු අය කිරීම.**

**යෝජනාව**

1897 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දොම්පෙ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන කර්මාන්ත ශාලා වලින් ජනනය වන කසල සනීපාරක්ෂිත කසල රදවනය වෙත බැහැර කිරීම වෙනුවෙන් 2023 වර්ෂය සදහා පහත සදහන් පරිදි මුදලක් අය කිරීමට යෝජනා කරමි.

| ප්‍රමාණය | කි.ග්‍රෑ.01 සිට 10000 දක්වා | කි.ග්‍රෑ.10000 සිට කි.ග්‍රෑ 20000 දක්වා | කි.ග්‍රෑ.20000ට වැඩි |
|---|---|---|---|
| මසකට අය කරන මුදල කි.ග්‍රෑ.1ක් සදහා | රු.6.00 | රු.7.50 | රු.10.00 |

මෙම සියලු ගාස්තු සඳහා රජයේ අනුමත බදු මුදල් අය කෙරේ

**එම යෝජනාව ගරු මන්ත්‍රී සරත් ප්‍රියන්ත දීපාල් රංජන්දේව මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**ඊ) 16. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

**දොම්පෙ ප්‍රාදේශීය සභාව**

**2023 වර්ෂයට අදාලව ත්‍රී රෝද රථ නවතා තැබීම සඳහා ගාස්තු අය කිරීම.**

**යෝජනාව**

1897 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පනවා ඇති අතුරු ව්‍යවස්ථාව අනුව 1988 දරණ 2016.10.07 දිනැති ගැසට් නිවේදනය හා1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතට අනුකූලව සකසන ලද අංක 1947/6 දරන 2015.12.28 දිනැති ගැසට් පත්‍රය හා 1976/21 දරණ 2016.07.20 දිනැති ගැසට් පත්‍රයේ සඳහන් ත්‍රී රෝද රථ නවතා තැබීම පිලිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව පහත සඳහන් ත්‍රීරෝද රථ නැවතුම්පොළ වල නවතා ඇති ත්‍රී රෝද රථ වලින් 2023 සඳහා ගාස්තු අය කිරීමට යෝජනා කරමි.

| ත්‍රී රෝද රථ නවතා තබන ස්ථානය | එක වාරයකට නවතා තැබියහැකි ත්‍රී රෝද රථ සංඛ්‍යාව |
|---|---|
| 01. කිරිදිවැල නගරයේ සතිපොල අසල හංවැල්ල පාර ත්‍රී රෝද රථ නැවතුම්පල | 05 |
| 02. යූමී බේකර්ස් හවුස් අසල ත්‍රී රෝද රථ නැවතුම්පල | 11 |

<u>අයකරන ගාස්තු :</u>

එක් ත්‍රී රෝද රථයක් සඳහා වර්ෂයකට ගාස්තුව :- රු.600.00

මෙම සියලු ගාස්තු සඳහා රජයේ අනුමත බදු මුදල් අය කෙරේ.

**එම යෝජනාව ගරු මන්ත්‍රී චන්දන කැළුම් ප්‍රියදර්ශන විසින් ස්ථිර කරන ලදී.**

**ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සහා සම්මත විය.**

**ඊ) 17. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

**2022.08.09 දිනැති ටෙන්ඩර් මණ්ඩල රැස්වීමේදී 2023 වසර සඳහා ටෙන්ඩර් කැඳවීමේදී අවම ලංසුව රු.ලක්ෂ 10 ට වැඩි දේපල පමණක් පුවත්පත් දැන්වීමේ පලකිරීමට තීරණය කළද, මෙවර දේපල තක්සේරුකරණයේදී ලක්ෂ 10 ට වැඩි දේපල ඇත්තේ එකක් පමණක් බැවින් , මෙවර ටෙන්ඩර් කැඳවීමේදී අවම ලංසුව රු.ලක්ෂ 05 ට වැඩි දේපල පුවත්පතෙහි පල කිරීමටත් එම දැන්වීම එක් භාෂාවකින් එක් පුවත්පතක පමණක් පලකිරීමටත් සුදුසු බව මම මෙම ගරු සභාවට යෝජනා කරමි.**

**එම යෝජනාව ගරු උපසභාපති අජිත් සිසිර කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**ඊ) 18. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

**2022.02.17 දින මහා සභාවේ න්‍යායපත්‍ර අංක (ඊ) 05. යටතේ සභා සම්මත වී ඇති පරිදි මහසභාවේ ආවරණ අනුමැතියට යටත්ව සිදුකරන ලද ගෙවීම් සඳහා මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බව මම මෙම ගරු සභාවට යොජනා කරමි. (ඒ අනුව 2022.10.13 දින දක්වා මහා සභාවේ ආවරන අනුමැතියට යටත්ව සිදුකරන ලද ගෙවීම් ඇමුණුම් අංක 01 යටතේ ඉදිරිපත් කර ඇත.)**

**එම යෝජනාව ගරු මන්ත්‍රී රාජා ලක්ෂ්මන් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**ඊ) 19. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමා විසින්, 2016 සැප්තැම්බර් 09 දිනැති අංක 1983/30 අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් නාගරික සංවර්ධන ප්‍රදේශ ලෙස නියමයන් ප්‍රකාශ කිරීමේදී දොම්පෙ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. නමුත් දොම්පෙ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නොදියුණු හා දුෂ්කර ගම්මාන විශාල ප්‍රමාණයක් පිහිටා ඇති බැවින් මේ සම්බන්ධව නැවත සලකා බලා දියුණු නාගරික ප්‍රදේශ හැර දොම්පෙ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි නොදියුණු හා දුෂ්කර ගම්මාන නාගරික සංවර්ධන ප්‍රදේශ ලෙස නම් කිරීමෙන් ඉවත් කිරීමට කටයුතු කරන ලෙස නාගරික සංවර්ධන අමාත්‍ය තුමාගෙන් ඉල්ලා සිටීම සුදුසු බව මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු මන්ත්‍රී සරත් ගාමිණී මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

**ඊ) 20. ගරු මන්ත්‍රිනි අජන්තා රෝහිනී මිය යෝජනා කරයි ඃ-**

**මුල් යෝජනාව ඃ-**

<u>**2022** අයවැය යෝජනා ඃ-</u>

- ❖ කුරුසපිටිය පලවන පටුමග - **250000.00**
- ❖ කුරුසපිටිය දෙවන පටුමග - **250000.00**
- ❖ කුරුසපිටිය පලවන පටුමග - **170000.00**

<u>සංශෝධිත යෝජනාව ඃ-</u>

- ❖ කුරුසපිටිය පලවන පටුමග - **670000.00**

**එම යෝජනාව ගරු මන්ත්‍රී ලලිත් වසන්ත පිරිස් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.**

ඊ) 21. ගරු මන්ත්‍රී එස්.එම්. රත්නසිරිලාල් මහතා යෝජනා කරයි ඃ-

<u>මුල් යෝජනාව ඃ-</u>

- ❖ පට්ටියගම පොදු නාන ළිදට යන මාර්ගය අළුත්වැඩියා කිරීම - රු.70000.00

<u>සංශෝධිත යෝජනාව ඃ-</u>

- ❖ පුගොඩ විශාඛා මාවතේ 4 වන අතුරු මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම - රු.70000.00

එම යෝජනාව ගරු මන්ත්‍රී නිශාන්ත අනුරජිත් වෙඩිසිංහ මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකගතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

ඊ) 22. ගරු මන්ත්‍රී මලින්ද ගුණරත්න මහතා යෝජනා කරයි ඃ-

දොම්පෙ ප්‍රාදේශිය සභාවේ වැකේ උපකාර්යාල බල ප්‍රදේශයට අයත් එගොඩ පැපිලියවල බෙලිගඩපිටිය වෙල්යාය මාර්ගය ප්‍රාදේශිය සභාවට පවරාගෙන සංවර්ධන කටයුතු කිරීම සුදුසු බව මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

- ❖ මාර්ගයේ දිග - මීටර් 650
- ❖ මාර්ගයේ පළල - අඩි 10-12 අතර
- ❖ මාර්ගයේ ආරම්භය ෑ නුගේදෙනිය පාර
- ❖ මාර්ගයේ අවසානය - අයි.ඩී.නිමල් මහතාගේ නිවස

එම යෝජනාව ගරු විපක්ෂනායක උභය කුමාර ජයවර්ධන මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකගතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

ඊ) 23. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-

සභා කර්මාන්ත 2022 යටතේ කිරිඳිවැල ත්‍රීරෝද රථගාල අසල (යූමී බේක් හවුස් ) ගොඩනැගිල්ල ඉහල මාලය ඉදිකිරීම ව්‍යාපෘතියට අදාල පළමු කොටස් සඳහා පාලුපැල්පිට පැරකුම් දෙටු පුරවැසි සුභසාධක සමිතිය වෙත රු 2,031,588.92 ක මුදලක් ගෙවීම සුදුසු බව මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ජගත් අතුකෝරල මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකගතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඊ) 24. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

2023 වර්ෂයට යෝජිත මේ සමග අමුණා ඇති උප ලේඛනයේ සඳහන් දොම්පෙ ප්‍රාදේශිය සභාව සතු දේපල බදු දීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ලබාදී ඇති තක්සේරුව පිළිගැනීමටත් එම තක්සේරු මුදල අවම ලංසුව ලෙස යොදා රුපියල් ලක්ෂ 05 ට වඩා වැඩි දේපල 2023 වර්ෂය සඳහා පුවත්පත් දැන්වීම් මගින් මව්භාෂාව මගින් ප්‍රසිද්ධ කිරීමටත් , රුපියල් ලක්ෂ 05 අඩු පසුගිය වසරේ ටෙන්ඩර් ලබානොගත් හා ටෙන්ඩර් ලබාගෙන මුදල් ගෙවීමට අපොහොසත් වූ අසාර්ථක වූ දේපල තක්සේරු මුදලට වැඩි අගයකින් ලබා ගැනීමට යමකු ඉල්ලා සිටියහොත් එම දේපල එසේ ලබාදීමටත් ඉතිරි දේපල ප්‍රාදේශීය වශයෙන් ප්‍රසිද්ධකර ටෙන්ඩර්කර ලබාදීම සුදුසු බවටත් මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ජගත් අතුකෝරල මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඊ) 25. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

දොම්පෙ ප්‍රාදේශිය සභාව සතු පොදු තාවකාලික වගාව සඳහා 2023 වර්ෂයට බදු ලබාදීමට යෝජිත මේ සමග අමුණා ඇති උපලේඛනයේ සඳහන් ඉඩම් ප්‍රාදේශිය වශයෙන් ටෙන්ඩර්කර බදු ලබාදීම සුදුසු බව මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී සරත් ගාමිණි මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඊ) 26. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

දොම්පෙ ප්‍රාදේශිය සභාව සතු කඩ කාමර කුලී තක්සේරු වාර්තා අනුව පුගොඩ පොදු වෙළඳපල කඩ කාමර සඳහා ලබාදී ඇති මේ සමග අමුණා ඇති උපලේඛනයේ සඳහන් තක්සේරුව ඉතා ඉහල අගයක් ගන්නා බැවින් එම තක්සේරුව නැවත සමීක්ෂණයක් සිදුකර වාර්තා ලබාගන්නා තෙක් 2022 ඔක්තෝම්බර් 01 දා සිට ක්‍රියාත්මක කිරීමට තීරණය වූ පුගොඩ පොදුවෙළඳ කුලී තක්සේරුව 2023 ජනවාරි 01 දා සිට අය කිරීමටත් සුදුසු බව මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී බී.එල්.රාජු ආනල්ඩ් බුත්පිටිය මහතා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු උපසභාපති අජිත් සිසිර කුමාර මහතා (ශ්‍රී.පො.පෙ.)</u>
ගරු සභාපතිතුමනි, මෙහි දැන් මේ කඩවලට මිනිසුන්ට මේ වාරික දෙක තුනවත් කුලිය ගෙවාගන්න බැරි තත්වයක් උදාවෙලා තිබෙනවා.

<u>ගරු සභාපතිතුමා (ශ්‍රී.පො.පෙ.)</u>
ගරු මන්ත්‍රීවරුන,අපි මේ ගැන තීන්දුවක් ගන්න තෙක් වහා ක්‍රියාත්මක වෙලා ජනවාරි තෙක් කල් තියන්න මේ යෝජනාව දැමුවේ එනිසයි.

ගරු මන්ත්‍රී බී.එල්.රාජ ආනල්ඩ් බුත්පිටිය මහතා (ශ්‍රී.නි.ප.)

ගරු සභාපතිතුමනි, අපේ ආසනයේ ප්‍රධාන නගරය තමයි කිරිදිවැල නගරය. බැංකු 18 ක් තිබෙන වෙළඳ වටනාකමක් වැඩිම තිබෙන නගරය. කිරිදිවැල නගරය තුල මේ පාර අයිනේ තිබෙන කඩය රු.9400 යි. පුගොඩ එකේ රු.12800 ක් දාලා.පරණ කඩ පේලියට ජල, වැසිකිලි පහසුකම නැහැ. බස්ටැන්ඩ් එකේ බස්ටිකයි,ත්‍රීවීල් ටිකයි ගැහුවට පස්සේ කඩයට යන්න විදිහක් නැහැ.

(තක්සේරුව අඩුකරලා එවන්න කියලා යෝජනාවක් හැටියට දමන් ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී)

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඊ) 27. ගරු සභාපති පියසේන කාරියප්පෙරුම මහතා යෝජනා කරයි ඃ-**

දොම්පෙ ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත් පදනම මත වැඩ ඒකකයේ සේවය කරනු ලබන සේවකයින් 06 දෙනෙක් 2022.10.04 දින රාජකාරියේ යෙදී සිටියදී හදිසි අනතුරකට ලක්වීම මත රෝහල්ගතව ප්‍රතිකාර ලබන බැවින් එම සේවකයින් හට නොපැමිණි දින ගණනට පමණක් දින 14 කට උපරිමයකට යටත්ව දෛනික වැටුපක් ප්‍රාදේශීය සභාව සභාව මගින් ගෙවීම සුදුසු බව මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී දමිත් ප්‍රියශාන්ත මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඊ) 28. ගරු මන්ත්‍රී තාරක අබේවික්‍රම මහතා යෝජනා කරයි ඃ-**

2022 මන්ත්‍රී යෝජනා ඃ-

- ❖ වීදිපහන් සඳහා - 50000.00
- ❖ ප්‍රජා මණ්ඩල සඳහා - 300000.00
- ❖ ක්‍රීඩා උපකරණ ලබාදීම - 200000.00

සංශෝධිත යෝජනාව ඃ-

- ❖ වේරහැර ප්‍රජාශාලාව සාදාගැනීම සඳහා පස් දමා ඉඩම ගොඩකිරීම - 550000.00

එම යෝජනාව ගරු මන්ත්‍රී බී.එස්.අයි.දයාසුන්දර මහතා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් එකඟතාවය විමසා සිටින ලදුව බෙදීමක් ඉල්ලා නොසිටි බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ඊ) කාරක සභා වාර්තා**

**1. 2022.09.28 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු රැස්වීම් වාර්තාව**

ගරු මන්ත්‍රී නීල් ද ඩග්ලස් සමරකෝන් මහතා (එ.ජා.ප.)

මෙහි අංක 07,11,12 සුසානභූමි වටේ කම්බි කණු සිටවලා සුසානභූමිය වටේ කම්බි කණු හිටවලා සංවර්ධනය කරන්න හදන එක ගැන.තිබෙනවා. අපේ අයවැය ලේඛනයෙන් සුසානභූමි සංවර්ධනය කරන්න මුදල් වෙන්කර තිබුනේ නැහැ.

දැන් අපේ වැඩ ඒකකයක් තිබෙනවා. ඒ වැඩ ඒකකයට අයවැයෙන් එක්කෝටි හැත්තෑ ලක්ෂයක් විතර මුදලක් වෙන්කර තිබුණා. ඒ වැඩ ඒකකයේ මීට කලින් කම්බි කණු නිෂ්පාදනය කළා, හියුම් පයිප්ප සහ තවත් කොන්ක්‍රීට් නිෂ්පාදන කළා. කම්බි කණු නිෂ්පාදනය සඳහා අච්චු වැඩ ඒකකයේ තිබෙනවා. අපි දැන් මෙවැනි ව්‍යාපෘතියක් කරන්න හදනකොට මේ කාල පරාසයත් එක්ක අපි මේ මහජනතාවගේ බදු මුදල් ඉතිරි කිරීම කළයුතු. අපේ වැඩ ඒකකයේ තිබෙන අච්චු ප්‍රයෝජනයට අරගෙන කම්බි කණු ටිකක් නිෂ්පාදනය කළහැකියි. එක සේවකයෙක් හිටයානම් ඇති. මේ වැඩ 3 ට 433 ක් විතර කම්බි කණු යනවා. මේ සඳහා සාමාන්‍ය වෙළඳපල මිල ලක්ෂ 6 කට වැඩියි. අපිට වැඩ ඒකකයෙන් මේ කම්බි කණු නිෂ්පාදනය කරන්න හැකියාව තිබියදී බාහිරින් ගන්න හදනවා. වෙළඳපල කම්බි කණුව ප්‍රමිතියෙන් යුක්තද කියා දන්නෑ. අපිට ප්‍රමිතියෙන් තොර කම්බි කණු ගන්නත් බැහැ. අපි ලක්ෂ 6 ක් විතර බාහිරින් මිලගණන් කැඳවා ගන්න හදනවා. අපිට මේ කම්බි කණුවක් හදන්න රු.1300 ක් විතර යයි. බාහිරින් ගන්න විට මෙයට රු.1500,1600 ක් කියයි. ලක්ෂ 6 ක් විතර වියදම් කරන මේ වැඩයට අපිට හැකියාව තිබෙද්දී මේ වැඩය කරන්නේ නැත්තේ ඇයි, පිරිවිතරයන් වලට බාහිරව අපිට ගන්න පුලුවන්කමක් නැහැ අපි කලින් පිරිවිතරයන් ඉදිරිපත් නොකලොත්. අපි මිලගණන් කැඳවා අපිට කම්බි කණු ලබාදියයුත්තේ කොහොමද කියා පිරිවිතරයන් ඉදිරිපත් කළයුතුයි. ඉස්සර එහෙම කළා. මේ සභාවේ මුදල් අපි නිර්ලෝභිව වියදම් කිරීම නෙවෙයි කළයුතු.

ලෝභිව මහජනතාවට දෙන බදු සල්ලි ඉතිරිකරන ක්‍රමවේදයකට යායුතුයි. එය අපේ පරම යුතුකම. එනිසා අපේ වැඩ ඒකකය හරහා කම්බි කණු නිෂ්පාදනයකර ඔබතුමා අදහස්දරන මේ වැඩය කළා නම් හොඳයි කියන අදහස ඉදිරිපත් කරනවා.

ගරු සභාපතිතුමා (ශ්‍රී.පො.පෙ.)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියූ කතාව පිළිගන්නවා. එයට දැන් වෙනම ගොඩනැගිල්ලක් හදාගෙන යනවා.එහි එක පැත්තක ප්‍රිමික්ස් ඒකකය සඳහාත් අනිත් පැත්ත කොන්ක්‍රීට් නිෂ්පාදන සඳහාත් ඉඩකඩ සකසා තිබෙනවා.එහි විදුලිය ගත්තහම එය ක්‍රියාත්මක කරනවා. මේ දාලා තිබෙන්නේ ඉල්ලීම්. මිලගණන් කැඳවලා නියම ක්‍රමයටයි ක්‍රියාත්මක කරන්නේ.

පුගොඩ කුමාරිමුල්ල කනත්තේ ගැටලුවක් තිබුණා. එය විසඳුවා. එනිසා මෙය විසඳුනු වෙලාවේ සල්ලි වියදම්කර හෝ ක්‍රමානුකූල නොකළහොත් ප්‍රශ්නයක්. මිනිස්සු එකඟ වූ වෙලාවේ නොකෙරුවොත් ලොකු ප්‍රශ්නයක්. මැනලා මින්න්දෝරු මහතෙක් මායිම් ගැහුවා. ලාභය බල බල හිරියොත් ආයිත් මිනින්දෝරු ගාස්තුයි ආයි ප්‍රශ්නයි එනවා. කොහොමවුනත් ඔබතුමා කියූ දේ අපි අනුගමනය කරනවා.

(ලේකම් මහතා වෙනත් රාජකාරි කටයුත්තක් සඳහා පිටත්ව යන බැවින් ප්‍රධාන කළමනාකරණ සහකාර මහත්මිය ලේකම් වශයෙන් වැඩබලන බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී)

ගරු උප සභාපති අජිත් සිසිර කුමාර මහතා (ශ්‍රී.පො.පෙ.)

ගරු සභාපතිතුමනි, කුමාරිමුල්ලේ ඔය ඉඩමේ එක පැත්තක් වෙලාවකට වතුරට යටවන තැනක්. දෙපැත්තෙන් කට්ටිය අල්ලගෙනත් තිබෙනවා. මෙය මුදලක් අරන් දෙන කෙනාට අවුරුදු දෙකකටවත් අඩු වශයෙන් දියයුතුයි. අවුරුද්දකට දීමෙන් ඒකෙනාට හරියට ගොවිතැන් කරගන්න බැහැ. එනිසා කෙනෙකුට ගොවිතැන් කරගන්න කාල සීමාවකට බදුදෙන්න කියා ඉල්ලා සිටිනවා.

ඒ සඳහා ලබන සභාවට යෝජනාවක් ඉදිරිපත්කරන ලෙස ගරු සභාපතිතුමා පවසන ලදී.

<u>ගරු මන්ත්‍රිනි එස්.ඒ.ඩී.වික්‍රමරත්න මිය (එ.ජා.ප.)</u>

ගරු සභාපතිතුමනි, ඒ ඉඩමේ ගොවිතැන් කරන අයටම කතාකර ලබාදෙන්න. දැනට ගොවිතැන්කරන අය 03 ක් ඉන්නවා. ඕවිටිගම පොදු සුසානභූමිය රාජු මන්ත්‍රීතුමාගේ මහප්පයි පරිත්‍යාගකර තිබන්නේ. ඒ ඉඩම දැන් එන්න එන්නම කොටවෙනවා. වට මැනලා තියන ප්‍රමාණය හරි ආරක්ෂා කරගන්න කටයුතු කළොත් හොඳයි කියා යොජනාකරනවා.

<u>ගරු මන්ත්‍රී බී.එල්.රාජු ආනල්ඩ් බුත්පිටිය මහතා (ශ්‍රී.නි.ප.)</u>

ගරු සභාපතිතුමනි, ඕවිටිගම සුසානභූමියට මම එක ගමනක් යනකොට එක ගෙදරක වැසිකිලිය තිබෙන්නේ මිනී කනත්තේ. අපි එක පාරක් පාලිත තාක්ෂණ නිලධාරි මහත්තයත් එක්ක ගිහින් කම්බි වැට ගැහුවා. දැන් ආපහු වැට නැහැ. කාටත් මෙය ඕන වෙනවා. ආදාහනාගාරයට යන්නැති අයත් ඉන්නවා. එනිසා මේ සුසානභූමිය ආරක්ෂා කරන්න වැඩ පිලිවෙලක් සකස් කරන්න කියා ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපතිතුමා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු මන්ත්‍රීවරුනි,මේ සුසානභූමි ප්‍රශ්න නිරන්තයෙන් ප්‍රාදේශීය සභාවට එනවා .ඒවාට මන්ත්‍රීතුමන්ලා පොඩ්ඩක් මැදිහත්වෙලා ඒ ප්‍රශ්න විසඳමු.

ඉහත සංශෝධන වලට යටත්ව දොම්පෙ ප්‍රාදේශීය සභාවේ 2022.09.28 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාවේ සඳහන් නිර්දේශ සභාව පිළිගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු මන්ත්‍රී රාජා ලක්ෂ්මන් මහතා විසින් ස්ථිර කරන ලදී.

2. 2022.10.04 දින පැවති කාර්මික සේවා කමිටු රැස්වීම් වාර්තාව

<u>ගරු මන්ත්‍රී ගාමිණී නිහාල් විජේරත්න මහතා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු සභාපතිතුමනි, 2022.10.04 දින පැවති කාර්මික සේවා කමිටු රැස්වීම් වාර්තාව සභාව පිළිගැනීම සුදුසු බව මම යෝජනා කරනවා.

මේ වෙනකොට සභා කර්මාන්ත නොකෙරුන ව්‍යාපෘති 44 ක් තිබෙනවා. මේ පිළිබඳව ගරු මන්ත්‍රීවරුන්ගේ අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිනවා.

සභාපතිතුමා සඳහන් කළා වගේ පසුගිය දිනක අපේ වැඩ ඒකකයේ ට්‍රැක්ටරය හදිසියේ අනතුරකට ලක් වුනා. ඒ අවස්ථාවේ කම්කරුවන් 06 දෙනෙක් රෝහල් ගත කළා. මේ වනවිට එක් අයෙක් කොළඹ ජාතික රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටිනවා .එයාගේ උකුල් ඇටේ පැනලා. කෙනෙක් ළඟ තියේනනත් වෙනවා. ඒ අයගේ වියදම අවස්ථානුකූලව සභාපතිතුමා විසින් පෞද්ගලිකව දැරුවා. ඉදිරියටත් තවදුරටත් ආයුර්වේද ප්‍රතිකාර කරන්නත් මුදල් අවශ්‍යවෙනවා. එනිසා අපි ආධාර පත්‍රයක් ලෑස්ති කළා. පුලුවන් විදිහට මුදල් ලබාදන්න කියා ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපතිතුමා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු මන්ත්‍රීතුමනි, කමිටු වාර්තාවේ ඇමුණුමේ තිබෙන ව්‍යාපාති ටික බලන්න. පක්ෂ විපක්ෂ දෙපැත්තේම මන්ත්‍රීවරුන්ගේ යෝජනා තිබෙනවා. ඒ නිසා බලලා ඒ ව්‍යාපෘති අවසන් කරන්න.

<u>ගරු මන්ත්‍රී බී.එල්.රාජු ආනල්ඩ් බුත්පිටිය මහතා (ශ්‍රී.නි.ප.)</u>

ගරු සභාපතිතුමනි, ගිය පාර කරන්න බැරි වුනු ව්‍යාපෘති ණයගිම් ලේඛනයට දාලා තිබෙනවා. ඒකට ගන්න ඕන ක්‍රියා මාර්ගය මොකක්ද,

<u>ගරු සභාපතිතුමා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. අපි ඒක ආදායමට ගත්තා.

<u>ගරු මන්ත්‍රී දමිත් ප්‍රියශාන්ත මහතා (එ.ජා.ප.)</u>

ගරු සභාපතිතුමනි, මේ දවස්ව කඨින පෙරහැරවල් තිබෙන නිසා පාරවල් දෙපස කැලය ශුද්ධ කරන්න අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිනවා.

මෙය කුමාර මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයේ ප්‍රශ්නයක්. එතුමා මට කතා කරන්න කියා ගෙනත් දුන්නා. ඔබතුමා දන්නවා ජයසිංහ මහතාගේ ප්‍රශ්නය. එතුමාට 10 ලිපියක් ලැබී තිබෙනවා. මෙම මාර්ගයේ කාණුව ඉදිකිරීමට පෙර ඔබගේ ප්‍රවේශ මාර්ගය ඉදිරීපිට පස් කොටස ඉවත්කර ප්‍රවේශය අවහිර නොවන පරිදි සකස් කරන්න කියලයි.

කාණුව හදලා ඔහුගේ ගෙදරට යන ප්‍රවේශ මාර්ගයත් හදලා දෙන්න කියා ඉල්ලා සිටිනවා.

එයාගේ ගේ ළඟ පස් ටික අයින් කළවිට එතන වලක් හැදෙනවා.එයාගේ ගේ ළඟින් වතුර ටික බස්සන්න දෙන්නෙත් නැහැ. එහි දැන් වතුර ප්‍රශ්නය විසඳෙනවා. එයා කියන්නේ එයාගේ ගේ ළඟ පාත්කරලත් දෙන්න කියලයි. පාත් කලහම ආයි එතනට වතුර යන බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී කේ.ඒ.කරුණාජීව මහතා විසින් ස්ථිර කරන ලදී.

**(උ) වෙනත් වාර්තා**

1. මාසික ආදායම් වාර්තාව - 2022 අගෝස්තු
2. මාසික ආදායම් වියදම් වාර්තාව - 2022 අගෝස්තු

ඉහත සඳහන් මාසික ආදායම් වාර්තාව හා මාසික වියදම් වාර්තා සභාව පිළිගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී සාලින්ද දේශප්‍රිය මහතා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු මන්ත්‍රී වන්දන කැළුම් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.

3. මාර්ග නඩත්තු ඒකකයේ දෛනික නඩත්තු කටයුතු පිළිබඳ වාර්තාව -2022 සැප්තම්බර්
4. දොම්පෙ ප්‍රාදේශීය සභාවේ ඩෙංගු ඒකකයේ දෛනික කටයුතු පිළිබඳ වාර්තාව -2022 සැප්තැම්බර්

අංක 3 සහ 4 යටතේ ඉදිරිපත් කර ඇති දොම්පෙ ප්‍රාදේශීය සභාවේ මාර්ග නඩත්තු ඒකකයේ හා ඩෙංගු ඒකකයේ දෛනික නඩත්තු කටයුතු පිළිබඳ සකස් කරන ලද වාර්තා මෙදින සභාවේ දැනගැනීම සඳහා සභාගත කරන ලදී.

5. 2022 වර්ෂයේ 4 වන කාර්තුව සඳහා විදුලි නඩත්තු උපකරණ මිලදී ගැනීම සඳහා වූ ඇගයීම් කමිටු වාර්තාව පිළිගැනීම ඇගයීම් කමිටු වාර්තාව පිළිගැනීම.
6. 2022 වර්ෂයේ දො.ප්‍රා.ස. ලියාපදිංචි ප්‍රජාමණ්ඩල සඳහා ක්‍රීඩා භාණ්ඩ ලබාගැනීම සඳහා වූ ඇගයීම් කමිටු වාර්තාව පිළිගැනීම.
7. ඇස්තමේන්තු අනුමැතිය සඳහා

| ව්‍යාපෘතියේ නම | මුදල |
|---|---|
| 1. දංගලල අමරසිංහ මහතාගේ නිවස දෙසට ඇති බෝක්කුව හා පැතිබැම්ම බැඳීම 11 අදියර | රු.500000.00 |
| 2. බදුවත්ත ග්‍රාම නිලධාරි වසමේ හේමන්ත මහතාගේ නිවස අසලින් පටන් ගන්නා අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම | රු.450000.00 |
| 3. පැලහැල දෙමළගම මාර්ගයේ මල්වත්ත අතුරු මාර්ගය ඉතිරි කොටස තොන්ක්‍රීට් කිරීම | රු.500000.00 |
| 4. නිකවල ගම්පලගෙදර ප්‍රජාශාලාව සංවර්ධනය කිරීම | රු.500000.00 |

ඉහත අංක 5 සහ 6 යටතේ ඉදිරිපත් කර ඇති ඇගයීම් කමිටු වාර්තා පිළිගැනීමටත් ඉහත අංක 7 යටතේ ඇති ඇස්තමේන්තු සභාව පිළිගැනීම සුදුසු බවටත් ගරු මන්ත්‍රී ජේ.ඒ.සනී ජයවර්ධන මහතා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු මන්ත්‍රී දුමාල් මධුසංක මහතා විසින් ස්ථිර කරන ලදී.

**(ඌ) වෙනත් කරුණු**

<u>ගරු මන්ත්‍රිනී නදීකා ප්‍රියංගනී මිය (එ.ජා.ප.)</u>

ගරු සභාපතිතුමනි,මම මීට පෙරත් කතා කළා. 225 කිරිදිවැල ප්‍රධාන මාර්ගයේ පරංගොඩ ඇලුමිනියම් වැඩපලේ සම්පූර්ණම වතුර හරවා තිබෙන්නේ ප්‍රධාන පාරට. ඇලුමිනියම් එකට කතාකර ඒ පාර හැදුවත් හදලා මාසයක් යන්න කලින් ඒ පාර කැඩිලා යනවා. ඒ පාරට නිසි ක්‍රියා මාර්ගයක් අරන් නැති නිසයි. ලොකු වලක් ඒ පාරේහැදිලා තිබෙනවා. මේ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිනවා.
403 පහල දොම්පෙ ග්‍රාම සේවා වසමේ පහල දොම්පෙ සිට කිඹුල්විලවත්ත දක්වා දිවෙන මාර්ගයේ ගමන් කරන්න බැහැ තාර කැඩිලා වලවල් හැරී තිබෙනවා. ප්‍රීමික්ස් අතුරා සංවර්ධනය කර දෙන මෙන් ඉජලා සිටිමින් මම නිහඩවෙනවා.

<u>ගරු මන්ත්‍රී ජේ.ඒ.සනී ජයවර්ධන මහතා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු සභාපතිතුමනි, මම මේ අවස්ථාවේදී කරුණු කීපයක් පිළිබඳව ඔබේ අවධානය යොමු කරන්න කැමතියි.පළමුවෙන්ම ප්‍රාදේශීය සභාවේ වත්මන් වැඩ පිලිවෙල යටතේ සිදුවියයුතු කරුණු කීපයක් මතක් කරන්න බලාපොරොත්තුවෙනවා. පසුගිය අවුරුදු ගණනාව තුල දොම්පෙ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විශාල වැඩ කොටසක් කළා. පාරවල් කොන්ක්‍රීට් කළා,තාර දැමුවා, විදිපහන් සවි කළා. ඒවගේම විශේෂයෙන් කාපට් මාර්ග ගණනාවක් වැඩ ආරම්භකර ක්‍රියාත්මක වුනා. අද උදේට රූපවාහිනිය දැමුවහම වැඩිපුරම කියවෙන්නේ ප්‍රාදේශීය සභාව විසුරවන්නේ කවදද කියලයි. එනිසා අපි මේ කරගෙන ආ වැඩපිලිවෙල පිළිබඳව දැඩි අවධානයක් යොමුකළ යුතුයි. මගේ පැලහැල කොට්ඨාශයේ පසුගිය අවුරුදු කීපය තුල අස්සක් මුල්ලක් නැර කොන්ක්‍රීට් දාලා තිබෙනවා. අද මේ වනවිට ඒ සමහර කොන්ක්‍රීට් කැඩිලා වලවල් හැදෙන තත්වයට පත්වෙලා. ඒ කැඩිනු කොන්ක්‍රීට් පාරවල් හදන්න ව්‍යාපෘතියක් ආරම්භ කරන්න කියා ඔබතුමාගේ අවධානය යොමුකරනවා. මගේ කොට්ඨාශයේ කාපට් පාරවල් 5 ක් ආරම්භ කළා. සමහර ඒවා තවම අවසාන නැහැ. පැලහැල රඹුටන්වත්ත පාර කාපට් කළා වෙල කොටස ඉතිරිකර තිබෙනවා. සෝදා පාලුවට ලක්වන කොටස් තවම අවසන් කර නැහැ. ඒවගේම පැලහැල දෙමලගම මාර්ගය වෙල කොටස ඉතිරිකර තිබෙනවා සෝදා පාලුවට ලක්වන කොටස් පැතිබැම් බැඳලා සම්පූර්ණ කර නැහැ. එගොඩ පැලහැල පාරේ පාලම ඇතුලු වෙල කොටස හදලා නැහැ.ඉන්දොලමුල්ල පාර යන්න එන්න බැරිව තිබුණු පාරක්. ඉතාමත් හොඳට කාපට්කර තිබෙන නමුත් වතුර බැසයන කාණු නැති නිසා පාර විනාශ වෙමින් තිබෙනවා. අපිට වෙන්කරපු සල්ලි වලිනුත් අපි විශාල මුදලක් වෙන්කළා නමුත් ඒවා ක්‍රියාත්මක වීම අත්හිටවූ නිසා ඒවා ක්‍රියාත්මක වී නැහැ. කජුවත්තවිල ඉන්දොලමුල්ල මාර්ගය කොටසක් කාපට් කර වෙල කොටස කාපට් කර නැහැ. ආර්ථික ප්‍රශ්න මත මේවා ප්‍රමාද වුනත් විදේශීය ආධාර යටතේ මේවා ආරම්භ කරපු පාරවල්. මේවායේ මුදල් නැතිවෙන්නේ නැහැ. ඒ කොන්ත්‍රාත් කරුවන් ක්‍රියාත්මක නොවන්නේ කරන වැඩවලට නියමිත පරිදි මුදල් නොලැබෙන නිසයි. එනිසා මේ පාරවල්වල අඩුපාඩු සකස්කර අවසන් කරන්නට කොන්ත්‍රාත්කරුවන් සමග සාකච්ජාකර යම්කිසි වැඩ පිලිවෙලක් යොදන්න කියන ඉල්ලීම කරනවා.

2022 විවිධ ව්‍යාපෘතිවලට මුදල් වෙන්කළා. නමුත් රටේ පවතින ආර්ථික පරිහානිය නිසා ඒ ව්‍යාපෘති අද සම්පූර්ණයෙන් නතරකර තිබෙනවා. යම් යම් ව්‍යාපෘති තිබෙනවා රජයේ මුදල් නොලැබුනත් කළයුතු දේවල්. උදාහරණයක් වශයෙන් පැලහැල හපන්ගමවත්ත වෙන්දේසි ඉඩමෙ ප්‍රජාශාලාවක් ඉදිකරන්න කටයුතු කළා. ලක්ෂ හත අටක් වියදම් කළා. අද වහලය ගහලාවත් නැහැ.
අර මුදල් නොලැබෙන නිසා අඩපණ වෙලා තිබෙනවා. ප්‍රාදේශීය සභාවේ තිබෙන මුදල් වලින් හෝ ඒ අතරමග නතර කරපු ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න යම්කිසි ක්‍රියා මාර්ගයක් ගන්න කියා විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

2021 ප්‍රාදේශීය සභා අරමුදල්වලින් මම වෙන්කළ ව්‍යාපෘති කීපයක් දැනට ක්‍රියාත්මක නොවී තිබෙනවා.පැලහැල දෙමලගම මාර්ගයේ මල්වත්ත අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීමට ලක්ෂ 5 ක් වෙන්කර තිබෙනවා. අද එහි ඇස්තමේන්තු හදලා ඉදිරිපත්කරන බව කිවුවා. තව මම 170000/- ක මුදලක් ප්‍රජා මණ්ඩලවලට පුටු ගන්න වෙන්කළා. මම එදා සිටන් මිලදීගන්න කිවුවා.මේ අවුරුද්ද මුලදී පුටුවක මිල තිබුනේ රු.2000 යි. අද පුටුවක මිල හාරදාස් ගණනක්.තවමත් මිලදී ගත්තේ නැහැ. එයින් වන්නේ එදා පුටු 80 ක් ගන්න තිබුණු එක දැන් ගන්න වෙන්නේ 40 යි. විදිපහන් මිලදී ගන්න රු.25000 ක් වෙන් කළා. අපි එදා ඉදන් මේවා ගේන්න කිවුවා.සෑමදාම කියනවා මිලගණන් කැඳවනවා, ලබන සතියේ ගේනවා කියනවා.මම විදිපහන් මිලදීගන්න පසුගිය අවුරුදු ගණනාව තුල විශාල මුදලක් වෙන්කළා. මම ඒවා ගත්තා කියා එකවර ඔක්කොම සවිකළේ නැහැ. කැරගල ප්‍රාදේශීය සභාවේ තියා අවශ්‍ය අවස්ථාවලයි ඒවා සවි කළේ. තවමත් මගේ ගෙනාපු ඒවා විදිපහන් 24 ක් තිබෙනවා. ඒවා ඉදිරි කාලය තුල  මම නම්කර තිබෙන  නිවැසියන්ගෙන් විමසා බලා ඒ විදිපහන් 24 සවිකරදෙන්න කියා ඉල්ලීම කරනවා.
මීට අමතරව මගේ දේශපාලන, පළාත් පාලන අතීතය පිළිබඳව පොඩි සටහනක් කරන්න බලාපොරොත්තුවෙනවා. මම ක්‍රියාශීලි දේශපාලනයට පිවිසියේ 1965 යි.1967 දොම්පෙ ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ මධ්‍ය සංවිධානයේ ලේකම් වුනා. ඒ දිවංගත පීලික්ස් ඩයස් බණ්ඩාරනායක මහත්තයගේ කාලයෙයි.ඊට පසු දිවංගත අනුර බණ්ඩාරනායක මහත්තයගේ කාලයෙත් මම ලේකම්. ඊළගට පී.එස්.පී.විජේසේකර මැතිතුමගේ කාලයෙත් මම ලේකම්. ඊට පසු මම උපාලි ගුණරත්න මැතිතුමාගේ කාලයෙත් මම ලේකම්.අවුරුදු 52 ක් මධ්‍ය සංවිධානයේ ලේකම් විදිහට එක දිගටම උන් කෙනෙක් මම. පැලහැල ගමේ ශ්‍රී.ල.නි.පක්ෂ ශාඛා සමිතියේ අවුරුදු 45 ක්  එකදිගට ලේකම් ලෙස මම කටයුතු කළ කෙනෙක්. ඉදිරි කාලය තුල අපි මොන මොන තීරණ ගනීද දන්නේ නැහැ. එනිසා අපේ නවක ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට සහ පැරණි අයට මතක් වෙන්නට මේ සටහන් ටික කළේ. මම 1968 දී කැරගල ගම් සභාවේ පැවති අතුරු මැතිවරණයට මම තරග කරලා මම දිනුවා විතරක් නොවෙයි කැරගල ගම් සභාවේ උපසභාපති බවට මම පත් වුනා. අවුරුදු 10 ක් මම උන්නා.1968 සිට ඇතිවු සිදුවීම්වල විශේෂ සිද්ධි කීපයක් මතක් කරනවා. 1988 කැරගල ගම් සභා කර්යාලය ගිනි තබා පුලුස්සා දැමුවා. ජ.වි.පෙරමුණේ සාමාජිකයින් කියාගන්න පිරිස තමයි එය කළේ. එයට මේ අද ඉන්න ජ.වි.පෙරමුණේ මන්ත්‍රීවරුන්ට මන්ත්‍රීතුමියන්ට චෝදනා කරනවා නොවෙයි.වර්තමානයේ ජ.වි.පෙරමුණේ  ඔබතුමන්ලා මෙයට කිසිසේත් වගකිවයුතු නැහැ. 1988 ඒ ගින්නෙන් ගිනිගත් රොඩු ගොඩෙ තිබිලා මම මේ එදා  අත්සන් කරපු පැමිණීමේ ලේඛනය මට එක්කෙනෙක් ගෙනත් දුන්නා. 1967 අත්සන් කළ පැමිණීමේ ලේඛනය. එදා සිදුවු සිදුවීම් අද මේ හුගදෙනෙක් දන්නේ නැහැ. 1988 වනවිට ප්‍රදේශවල තිබු තත්වය කුමක්ද, මේ රටේ වාමාංශික යයි කියන කී දාහක් මරලා දැමුවාද 1988 ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාත්මක කාලය තුල. සමහර ප්‍රදේශවල වාමාංශික මිනිසුන්ගේ බෙලි කපලා කෝටුවේ ගහලා පාරවල් අයිනේ ප්‍රදර්ශනය කළා .  ගමේ මිනිසුන්ගේ හැදුනුම්පත් එකතුකර ගිනි තිබ්බා. මේවා අද කාටවත් මතක නැහැ. දොම්පෙ ආසනේ  කී දෙනෙක් ඒ කාලයේ මරලා පුච්චලා දැමුවාද, වල්පොල කනත්තේ කටුපිටිය කනත්තේ දවස ගානේ එක්කෙනෙක් දෙන්නෙක් මරලා පුච්චනවා. අපේ හිටපු සංවිධායකවරයෙක් වු පී.එස්.පී.විජේසේකර මැතිතුමා මරලා දැමුවා. කැරගල සිරිල් අයියා මරලා දැමුවා. මේවගේ කටුක අතීතයක් තිබු බව මතක් කළයුතුයි. මේකට වගකිවයුතු අයත් මතක තියන අයත් අද නැහැ.
මම 1991 සිට අද වෙනකම් අවුරුදු 31 ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන්ද,විපක්ෂනායකවරයෙක් වශයෙන්, උපසභාපතිවයෙක් වශයෙන් ඒවගේම තුන් පාරක් සභාපති වරයෙක් වශයෙන්ද මම උන් බව  සතුටින් මතක් කරනවා.මේ විපක්ෂනායකතුමාට ඒක මතක ඇති. මම ප්‍රාදේශීය සභාවේ ඇවුරුදු 31 යි. ගම්සභාවේ අවුරුදු 10 යි. අවුරුදු 41 ක් මහජන නියෝජිතයෙක් වශයෙන් මේ දොම්පෙ ආසනයේ ඉදලා තිබෙන බව විශේෂයෙන් මතක් කළයුතුයි. මගේ ධූරකාලය තුල අවංකව මිනිස්සුන්ට වැඩ කරන්න කටයුතු කළා. උපරිම සේවයක් කරන්න බලාපොරොත්තු වුනා. මම කවදාවත් පාරකට කොන්ක්‍රීට් දානකොට එතනට ගිහින් කොන්ක්‍රීට් ඇනුවේ නැහැ. කණුවක් ළග ලයිට් එක  හයි කරනකම් එතන හිටගනෙ සිටයේ නැහැ. නමුත් ඒ ඔක්කොම කළා. මේ අවුරුදු හතලිස් ගානට මේසා විශාල වැඩ ප්‍රමාණයක් මට කරන්න හැතිවුනේ විශේෂයෙන් එදා හිටපු ගරු මන්ත්‍රීවරුන්ගේ පූර්ණ සහයෝගය මට ලැබුණු නිසයි. ඔබතුමාට මතක ඇති එදා අපි දේශපාලනය කරනකොට පිටින් කථිකයෝ ගෙනාවේ නැහැ. අපි දෙන්නයි , රංගසිරි මහත්තයයි ,කාන්ති රාමනායක මහත්මියයි අපි ආසනේ රැස්වීම් 10 ක් තිබුනානම් අපි ඒ දහයටම ගිහින් කතාකර සංවිධානය වුනේ. මේනොදන්න අයට දැනගන්නට මතක්කිරීම මගේ යුතුකමක් ලෙස සලකනවා. මේ වකවානු තුල මේ සියළු කටයුතු කරගෙන යන්නට ප්‍රාදේශීය සභාවේ නිලධාරින් මට පූර්ණ සහයෝගය ලබාදුන් බව විශේෂයෙන් සඳහන් කළ්‍යුතුයි. සෑම අවස්ථාවකම පාලක පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් පමණක් නොවෙයි විපක්ෂනායක උභයකුමාර මහතා ඇතුලු විපක්ෂයේ සියළුදෙනාගේ සහයෝගය මට එදා සම්පූර්ණයෙන් ලැබුණු බව මම ගෞරයෙන් සිහිපත් කරනවා. මම අවුරුදු 55 ක් දේශපාලනකර අවුරුදු 42 ක් ප්‍රාදේශීය සභාවේ පාලනයේ රැදිලා සභාපති වශයෙන් 3  පාරක් ඉදලා තිබෙනවා. මගේ ජීවිතකාලය තුල මේ අවුරුදු පනස් ගානටම එක පර්චස් එකක්වත් මිලදී අරගෙන නැහැ. මට අපේ තාත්තා දුන්න පර්චස් 90 න් මම එක පර්චස් එකක්වත් විකුණලත් නැහැ. මම එදා සිටියෙක් අද ඉන්නෙත් බැංකුවෙන්  ණයක් අරගෙන හදපු නිවසෙයි.
මගේ දේශපාලන  ජීවිතය තුල ප්‍රදේශවාසීන්ගේ සම්පුර්ණ සහාය මට ලැබුණා. පළාත් පාලන ජීවිතය තුල පළාත් පාලන ආයතනයේ සියළුම නිලධාරීන්ගේ සහාය මට ලැබුණා. මම ඉතාමත්ම අගය කොට සලකනවා. මම දේශපාලනයෙන් ඉවත්වෙන්නේ නැහැ. ඉදිරියටත් ඉන්නවා. සමහරවිට ක්‍රියාත්මක පළාත්පාලන සේවයේ නොඉන්න පුලුවන්. ඉදිරියටත් එදා වගේම ඔබ සියළුදෙනා සමග සුහදව කටයුතු කරන බව සඳහන් කරමින් මට පසුගිය වකවානුව තුල  ලබාදුන් සහයෝගය පිළිබඳව මගේ අවංක ස්තුතිය පුදකරමින් සියළුදෙනාටම සුභ අනාගතයත් ප්‍රාර්ථනා කරමින් මම නිහඩවෙනවා.

<u>ගරු සභාපතිතුමා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු මන්ත්‍රීවරුනි, එතුමාගෙන් ප්‍රශ්න කීපයක් මතු වුනා. කාපට් පාරවල් ප්‍රශ්නය.මෙය බරපතල ප්‍රශ්නයක්. මේ වනවිට භාගෙට හැදු පාරවල් ගණනාවක් තිබෙනවා. මගේ ගේ ඉස්සරහ පාරත් අතරමග නැවතී තිබෙනවා.  මෙය ප්‍රාදේශීය සභාවට මුහුනදී විසදාගන්න බැරි ප්‍රශ්නයක්. නමුත් යන්න පුලුවන් මට්ටමට හදාගන්න පුලුවන් තැන් තිබෙනවානම් පැලහැල ඒ පාරෙත් පල්ලම යන්න බැරි බව මට සනී ජයවර්ධන මහතා ාමට කතාකළා. ඒ අනුව තාවකාලික පැලැස්තර දාලා තිබෙනවා. ස්ථිර විසදුම් සොයන්න අපිට වර්තමානයේ හැකියාවක් නැහැ.

අනිත් එක අතරමග ණතර කරපු ව්‍යාපෘති. මෙය නෛතික ප්‍රශ්නයක්. අතරමග නතරකරපු ව්‍යාපෘති ප්‍රාදේශීය ලේකම් හරහා ඇස්තමේන්තු අනුමතකර වෙනත් මුල්‍ය ප්‍රතිපාදන යටතේ හදන්න දාපුවා. අපේ සල්ලි දාලා ආයි මෙය හදන්න ක්‍රමවේදයක් නැහැ. එය කළොත් යම්කිසි විදිහකින් නිලධාරීන් කොතනින්ද පටන් ගන්නේ කියා යම් අපහසුතාවයකට පත්වෙනවා. ප්‍රතිපාදන වර්ග දෙකක් එක ව්‍යාපෘතියකට ආයතන දෙකකින් දැම්මේ ප්‍රශ්නයක් තිබෙනවා. මේ වනවිට දොම්පෙ ආසනයේ ප්‍රාදේශීය ලේකම්ගේ ව්‍යාපෘති බලධාරීත්වයෙන් හදපුවා ගොඩනැගිලි 12 ක් විතර තිබෙනවා. ඒවා ඉදිරි වැඩකටයුතු ටික කරගෙන යන්න බරපතල ප්‍රශ්නයක් වී තිබෙනවා. මේ සඳහා නීතිමය වශයෙන් යම් සහනයක් බලාපොරොත්තුවෙනවා. ඒවා දිගටම ඒ අය කරන්නේ නැතිනම් එතන සිටන් කරන්න අනුමැතියක් අරගෙන හෝ මුදල් වෙන්කරන්න බලාපොරොත්තුවෙනවා.
භාණ්ඩ මිලදී ගැනීම ගැන කිවුවා. අවුරුද්ද පටන්ගත්දා සිටන් කිවුවා. සැමදාම මිලගණණ් කැඳවනවා. මෙයට රටේ තත්වයත් බලපෑවා. අපේ මිලගණන් කැඳවලා මුදල් කමිටු තියා ටෙන්ඩර් කමිටු තියා මිලදීගන්න විට පහුවදා ගාන වැඩිවෙලා. දිනපතා භාණ්ඩ මිල වෙනස් වුනා. දැනට අවුරුදු දකකට විතර රු.900 ට තිබුනු පුටුයි දැන් 4000 වෙලා තිබෙන්නේ. මිල පිලිඅරගෙන ගන්න යනවිට ගණන් උස්සනවා. මේ ප්‍රශ්නය හුගක් මන්ත්‍රීවරුන්ට බලපෑවා. අවුරුද්ද මුල මේ සියල්ල කරනවානම් මෙයින් පොඩ්ඩක් ගැලවියහැකියි. දැන්වත් මන්ත්‍රීවරු තමන්ගේ වැඩවලට පුද්ගලිකව මැදිහත්වෙලා අදාල නිලධාරීන් හමුවෙලා ඒ කටයුතු කරන්න.
ඒවගේම සනී ජයවර්න මහතා කියු කතාවල් මාත් අනුමත කරනවා. අවංකව වැඩ කලා කියා කිවුවා. තවම ප්‍රාදේශීය සභාවේ ඉන්නේ එනිසයි. මේ රටේ හරියට කරපු මිනිස්සු එතනමයි. ඔබතුමා තවම මෙතනින් උඩට ගියේ නැත්තේ ඒ නිසයි .පී.එස්.පී.විජේසේකර මහතා සංවිධායක වෙන වෙලාවෙත් සංවිධායක සඳහා තරගයක් තිබුණා. එතනදීත් ඔබතුමා ඉදිරිපත් වුනේ නැහැ. විජේසේකර මහත්තයට දුන්නා. ඊට පසු මුල්ම පළාත් සභාවට අපේක්ෂකයෝ තෝරනවිට කතාකරලා තමයි වීරරත්න මහත්මයයි සනී ජයවර්ධන මහත්තයයි අයින් වෙලා සරත් කීර්තිරත්න මහත්තයටයි ගාමිණී ගුණරත්න මහත්තයටයි අවස්තාව දුන්නේ. සංවිධායකකම ගන්න මිනීමරන කාලෙක එතුමා ස්වේච්ඡාවෙන් අපේක්ෂකත්වය පරිත්‍යාග කළා. එතුමා ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් විදිහට තාම ඉන්න එක තමයි අවංකව වැඩ කලා කියන්න හොඳම උදාහරණය. ඒක පිලිගනිමින් එතුමාට තවත් දීර්ඝකාලයක් ප්‍රාදේශීය සභාවේ ගතකරන්න නෙවෙයි ඉදිරියට යන්න ශක්තිය ධෛර්ය වාසනාව ලැබේවයි කියා පතනවා.

<u>ගරු මන්ත්‍රී දමිත් ප්‍රයශාන්ත මහතා (එ.ජා.ප.)</u>

ගරු සභාපතිතුමනි, ඔබතුමත් හිටපු සභාපතිතුමා ගැන වර්ණනා කර කතා කළහම මටත් ලොකු ගෞරවයක් තිබෙන නිසා මමත් මේ වෙලාවෙම නැගිට්ටා. සනී ජයවර්ධන මහත්තයාගේ කාලයේ අපි මේ ප්‍රාදේශීය සභාවට භාණ්ඩ සැපයුවා.එතුමා අපිට ටෙලිෆෝන් කෝල් එකක්වත් දුන්නේ නැහැ ඒ නිදහස එතුමා අපිට දීලා තිබුණා
මෙතුමා සභාපතිකාලේ මම අපේ ගමේ පාරේ එක තැනක යන්න බැරි විදිහට කඩාගෙන ගියා. එතුමා හමුවෙන්න මම ගියා. මම අහවල් ගමේ මේකට මොකද කරන්න පුලුවන් කියා මම ඇසුවා. එතන බැම්මක් බැදිය යුතුමයි. නැතිනම් වාහනයක් යන්නම බැහැ. මට පුලුවන්ද බැම්ම බඳින්න කියා එතුමා ඇහුවා.මම එතකොට උසස්පෙළ කරලා අවුට් වුන ළමයෙක්. ඔබතුමා අවසර දෙනවානම් මම බඳින්නම් කිව්වා. ඔයා වැඩේ කරන්න මම සල්ලි දෙන්නම් කිවුවා. මම හැදුවා. බිල් ටික ගෙනත් දුන්නා.එතුමා සල්ලි දුන්නා. මට එතුමා ගැන ගෞරවයක් සහ සතුටක් ඇති වුනා.අපි දීර්ඝායුෂ ලැබෙන්න කියා වගේම අපි ප්‍රාර්තනා කරනවා මේ දේශපාලන ක්ෂේත්‍රයේ ඉහලට ගිහින් ඔබතුමාගේ දක්ෂතා පෙන්වන ලෙසඉල්ලා සිටිනවා.
කිරිදිවැල මධ්‍ය මහා විද්‍යාලය අද මේ වෙනකොට ලංකාවෙන්ම ශිෂ්‍යාබට කාන්තා කණ්ඩායම් වලින් 3 වෙනි සථානය අරන් තිබෙනවා. අපේ උණුසුම් සුභපැතුම් කිරිදිවැල මධ්‍ය මහා විද්‍යාලයේ කාන්තා ශිෂ්‍යාබට කණ්ඩායමට එකතු කරනවා.
කිරිදිවැල පාසල්වල ගැහැණු පිරිමි ළමයින්ගේ සම්බන්ධතා දැන් ඉස්සරහට වැඩිපුර යනවා. බස්ටෑන්ඩ් එකේ කඩ පේලිය අස්සෙත් ළමයි ඉන්නවා. එතනදි ගොඩක් සිදු නොවියයුතු දේවල් සිදුවන බව පොලිස් ස්ථානාධිපතිතුමා කිවුවා. අපි සභාවක් හැටියටත් මේ ළමයින්ට තිබෙන ඉඩ ප්‍රස්ථා නැවැත්වියයුතුයි. බස්ටෑන්ඩ් එකේ උඩ තට්ටුවේ
සභාවේ උඩ තට්ටුවේ හැසිරෙන විදිහ සභවක් හැටියට අපි මේවාට වගකිවයුතුයි. මේවාට ඉඩ ප්‍රස්ථා දෙන්න හොඳ නැහැ. ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමුකරන්න කියා ඉල්ලා සිටිනවා.
ගාමිණී මන්ත්‍රීතුමා දන්නවා කුට්ටිවිල මාර්ගයේ අවධානම් තත්වයක් තිබෙනවා.කම්බි ,කණු දාලා තිබෙනවා. ඒවා මේ වැස්සේ දිරනවා.මෙයට මොකක් හෝ කරන්න. මෙය දොම්පෙ ආසනයේ බරපතල හානියක් වී තිබෙන පාරක්. ඒ ගැන අවශ්‍ය තැන්වලට අවධානය යොමු කරවලා කටයුතු කරන්න කියා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු මන්ත්‍රීනී පද්මිණී සමරසේකර මිය (එ.ජා.ප.)</u>

ගරු සභාපතිතුමනි, මම පසුගිය කාලයේ මේ සභාවේ ඔබතුමාට යෝජනාවක් ගෙනාවා.පරතාපකන්දත් බංගලාවත්තත් සම්බන්ධවන තැන කඩාගෙන ගිහින් තිබුණා. එතන අපිට පිළිසකර කර දෙන ලෙස ඉල්ලා සිටියා. නමුත් තවම ඒ සම්බන්ධව ක්‍රියා මාර්ගයක් ගෙන නැහැ. එන්ඩ එන්ඩම වැඩි වැඩියෙන් කැඩීගෙන යනවා. දනට තාවකාලිව බැරල් ටිකක් තබා තිබෙනවා. එහි අපිට තාවකාලික විසඳුමකට යන්න පුලුවන්ද කියා සොයා බලා කටයුතු කරන්න. මෙය දැන් ප්‍රධාන පාරක් බවට පත්ව තිබෙනවා.
පුංචි මණ්ඩාවල පෙහෙකම්හල්වත්තේ පසුගිය කාලයේ ගරු වෙඩිසිංහ මන්ත්‍රීතුමාගේ ප්‍රතිපාදනයක් මගින් පොදු පහසුකම් සඳහා ක්‍රීඩාපිටියක් වශයෙන් වෙන්කරගෙන තිබු කොටසක ළිඳක් හදා තිබුණා. ඒ ළිඳ හැදීම ඒ අයට විශාල ප්‍රයෝජනයක් වී තිබෙනවා. නමුත් ඒ ඉඩම අපේ සභාවට අයත් නැහැයි කියා වටේ ඉන්න අය ඉඩමේ කොටස් එක්කර මායිම් කරගෙන තිබෙනවා. පසුගිය දවස්වල කැරගල තාක්ෂණ නිලධාරි මහත්තයා ඒ බැම්මත් බඳින එක අත්හිටවා තිබෙනවා. ඒ අත්හිටවුවත් අවසරයකින් තොරව ඒ පුද්ගලයා බැම්ම බැඳ තිබෙනවා.ඒ පිළිබඳව විමසීමේදී දැන ගැනීමට ලැබී තිබෙන්නේ සභාවට ඒ ඉඩම් කොටස අයිති නැති බවයි. අපි පොදු පහසුකම් යටතේ එහි ළිඳක් හදා තිබෙනවා.

ප්‍රදේශයේ යහපතට. ඒ ඉඩම මැනලා වෙන්කරගෙන දනටමත් තියන ප්‍රමානයවත් සභාව සතු කරගන්න හැකියාව තිබෙනවානම් ප්‍රදේශවාසීන්ට කරන යහපතක් වගේම සභාවේ වත්කමක් ආරක්ෂා කර ගැනීමක් කියා මම යෝජනා කරනවා. ප්‍රදේශවාසින් පසුගිය කාලයේ ඔබතුමාට ඒ පිළිබඳ ලිපියක් ඉදිරිපත් කළ බවත් කිවුවා. මා ළඟත් තිබෙන ලිපිය ඔබතුමාට බාරදෙන්නම්. මේ පිළිබඳව අවධානය යොමුකර වෙඩිසිංහ මනත්‍රීතුමාගේ ප්‍රදේශවාසීන් එක්කත් සාකච්චාකර මේ ඉඩම මිනින්දෝරු මහතෙකු ලවා මැනලා සභාවට පවර ගැනීමට හැකියාව තිබෙනවාද කියා බලන්න. මෙය සභාවට විශාල වටිනාකමක්.

ගරු මන්ත්‍රී විත්‍රානන්ද ජයවීර මහතා (ශ්‍රී.පො.පෙ.)

ගරු සභාපතිතුමනි, මුලින්ම හිටපු සභාපති සනී ජයවර්ධන මැතිතුමාගේ දේශපාලන දිවියට සුභපතනවා. සුසානභූමි ගැන ප්‍රශ්නයක් මතු වුනා. ඩග්ලස් මන්ත්‍රීතුමා කියපු දේ හරි. සුසානභූමිවල වැටවල් ගහන්න වෙනවා ඉක්මනින්ම. අපේ එගොඩ පැලහැල ඒවගේ ප්‍රශ්නයක් මතු වුනා. පර්චස් 20 ක් විතර අල්ලාගෙන ඉඳලා මැනුම් කටයුතුවලදී යම් ප්‍රමාණයක් ගත්තා. ඉක්මනින් කම්බි නොගැහුවොත් විවිධ ප්‍රශ්න වලට මුහුන දෙන්න වෙනවා. හැමතැනම වගේ ගස් කැපීම් පටන් අරගෙන තිබෙනවා. සාමාන්‍යයෙන් කුඩා කෝටුවක්වත් තියන්නෑ. කපනවා. ඉදිරියේදී පරිසර බලපත්‍ර දෙනකොට ලී ඇඹරීමට යම් ක්‍රමවේදයක් හැදුවොත් හොඳයි. 70,80 දශකවලදී වතුර බෝතලයක් තියන එක දකින්නවත් තිබුනේ නැහැ ගම්වල. වෙලකට ගියත් වතුර අරන් යන්නේ නැහැ. අද ඒ තත්වය නැතිවෙලා තිබෙනවා. අපේ ප්‍රදේශයේ තිබෙන ලොකුම කන්ද තමයි කැරගල දනවිකන්ද ඒකෙත් තියන ඇටිටෝනියා ගස් කපනවා හොරෙන්. මේ තත්වය නැති කළයුතුයි. පරිසර කලාපයක් බවට පත් කරන්න පුලුවන්නම් හොඳයි.

ගරු සභාපතිතුමා (ශ්‍රී.පො.පෙ.)
ගරු මන්ත්‍රීතුමනි, ඒක රක්ෂිත වනාන්තරයක් බවට පත්කරලා තිබෙනවා.

ගරු මන්ත්‍රී විත්‍රානන්ද ජයවීර මහතා (ශ්‍රී.පො.පෙ.)
ගරු සභාපතිතුමනි, නැත්නම් කුඹුරක් කොටන්නවත් වතුර නැතිව යනවා. වැලිවත්ත පාර ගැන සභාවේ ගොඩක් කතා කළා. නාලිකාවලත් ගියා. ලොකු වලවල් තිබෙනවා. කන්ද කොටස යන්නම බැහැ. වාහනයෙයක් යන්නම බැහැ. කන්ද කොටස හරි වැලිවත්තට යනකම් හරි හදලා දෙන්න කියන ඉල්ලීම කරනවා. මිනිස්සු අපිටත් බනිනවා. ඔඉතුමාටත් බනිනවා. ඒනිසා මෙය ඉක්මිනන් කරලා දෙන්න කියන ඉල්ලීම කරනවා.

ගරු මන්ත්‍රී වයි.ඒ.සරත් ගාමිණි මහතා (ශ්‍රී.පො.පෙ.)
ගරු සභාපතිතුමනි, අද දින සනී ජයවර්ධන මැතිතුමාගේ කතාව තුලින් එතුමාගේ දේශපාලන ඉතිහාසයේ අපි නොදන්න දේවලුත් දනගැනීමට හැකි වුනා. එතුමා දේශපාලනයට එනවිට මට අවුරුදු 03 යි. එහෙම බැලුවහම සනී මහත්තයා දේශපාලනයට එනවිට මේ සභාවේ ඉඳලා තිබෙන්නේ දෙතුන් දෙනයි. ඔබතුමා වගේ කෙනෙක් අපේ සභාවේ කටයුතු කරන එක අපි සියළුදෙනාටම හයියක්. ඔබතුමාට ඉදිරියටත් අපිත් සමඟ නිදුක් නිරෝගිව කටයුතු කරන්න ලැබෙන්න කියා ප්‍රාර්ථනා කරනවා.
අපි මිලගණන් වැඩි කිරීමේදී දොම්පෙ ප්‍රජාශාලාවේ රු.4000 තිබුණු එක රු.8000 කර තිබෙනවා. අපිට රු.8000 වැඩිය දෙන්නත් පුලුවන්. නමුත් හැම අවස්ථාවෙම බැලුවොත් මෙහි කුමන හෝ අඩුපාඩු දොර ජනෙල් හරියට නැහැ. ටොයිලට් ප්‍රශ්න,.කවුරු හෝ කුලියට ගත්විට ඒ මිනිස්සු බැන බැන යනවා. පුටු ටිකත් පිරින් ගේන්න වෙලා තිබෙනවා. ආදාහනාගාරය වගේම ආදයම් ලබන තැනක් මේ ප්‍රජාශාලාව. එනිසා ප්‍රජාශාලාවේ පුටු ටික දාලා තිබෙන අඩුපාඩු ටික හරියට හැදුවොත් රු.8000 ට වැඩි මුදලකට මේ ප්‍රජාශාලාව දියහැකියි.

අපිට සාහිත්‍ය උත්සවයට මේ අවුරුද්දේ උපදෙස් ලැබී තිබෙන්නේ සභාවේ මුදල් ඒ සඳහා පාවිච්චි නොකරන ලෙයසි. අපි එනිසා නොයෙකුත් ආයතනවල උපකාර ඇතිව මේ 27 වෙනිදා සාහිත්‍ය උත්සවය පවත්වනවා. ඒ සඳහා අපි සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ සහ මන්ත්‍රීතුමියන්ගේ පැමිණීම ගෞරවයෙන් අපේක්ෂා කරනවා.

පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය හරහා කෙරෙන වැඩ කටයුතු අපි කොපමණ කිවුවත් කෙරෙන්නේ නැහැ. සමනබැද්ද වේල්ගම පාර වලවල් ටික වහලා දෙන්න කිවුවා. වැහුවේ නැහැ. ගලකොන ලංසියාහේන දක්වා මාර්ගයේ දෙපස ඉලුක් වැවිලා තිබෙනවා. ඒ පාරේ යන්න බැහැ. ඒ පිළිබඳව දැනුවත් කරන්න කියා ඉල්ලා සිටිනවා.
ඔබතුමා සණස පාර සකස් කරන්න ගත් උත්සාහයට මගේ ගෞරවනීය ස්තුතිය පුදකරනවා. නමුත් එය සම්පූර්න වූ බවත් පේන්න නැහැ. තාමත් වතුර පිරෙන බව ඊයෙත් කතාකර කියනවා. පල්ලෙහාට කාණුව කපන්න දෙන්නෙත් නැහැ. ඒ මාර්ගයේ දිගටම ගලේවත්ත දක්වාම අබලන් වෙලා තිබෙනවා. ත්‍රීවීල් එකක යන්නම බැහැ. මේ පාර අබලන්වම නිසා ගොඩක් අපහසුතාවයට පත්වන්නේ සියනෑ ජාතික පාසලට යන ළමයි. එනිසා ඒ මාර්ගය සකස්කර ගැනීමට කුමක් හෝ උපක්‍රමයක් භාවිතාකර හදාගන්න කටයුතු කරමු කියන ඉල්ලීම කරමින් මම නිහඩවෙනවා.

ගරු මන්ත්‍රී ප්‍රියන්ත දිපාල් මහතා(ශ්‍රී.පො.පෙ.)

ගරු සභාපතිතුමනි, අද ගිරිඳර ශ්‍රීබෝධි විද්‍යාලය දොම්පෙ ආසනයේ තිබෙන හොඳම පාසල .ඒ පාසල ගාවට යනකම්වත් ඒ පාර හදාදෙන්න කියා ඉල්ලා සිටිනවා.

සනී ජයවර්ධන මැතිතුමා අද හොඳ ප්‍රකාශයක් කළා. එතුමාට අපි ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් හෝ සභාපතිවරයෙක් වශයෙන් නොවෙයි දෙමාපියෙකුට හා සමාන ආදරයක් ලෙන්ගතුකමක් දැක්වූවා. එතුමා අද මේ ප්‍රාදේශීය සභාවේ ඉන්න ඕනෑ මේ පුටුවේ නොවෙයි පාර්ලිමේන්තුවෙයි. පීලික්ස් ඩයස් බණ්ඩාරනායක මහතා වැනි පතාක යෝධයෙක් එක්ක දොම්පෙ ආසනේ ලේකම්කම කරන්න එදා පුලුවන්වූ එක ගැනත් අපි භාග්‍යක් ලෙස සලකනවා. අපි මෙතනට ආවේ ලේ කඳුලු හෙලලා. අපි දැන් ඒවායින් අහක්වෙලා තලත්තෑනි මට්ටමේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් විදිහට මේ සියලුදෙනාටම ආදරය කරමින් නිතවත්කම් දක්වමින් ප්‍රාදේශීය සභාවේ පක්ෂ විපක්ෂ නැතිව සහෝදරයෝ වගේ ජීවත්වන අය. තවත් එකක් කිවයුතුයි. අපේ ගමේ ගලක් තිබුණා. ඒ ගල කඩන්න ඒකාලේ උපාලි ගුණරත්න මැතිතුමත් සහයෝගය දැක්වූවා. මුලු ඔක්කොම කැමති වුනත් මම දොම්පෙ ආසනයේ සභාපතිතුමා ඔයගොල්ලො ගෙදර යන්න කියා එදා සනී ජයවර්ධන මැතිතුමා කිවුවා එදා. ඒ ගලත් අද එහෙමම තිබෙනවා. ඒවගේ වැදගත් හොඳ නීත්‍යානුකූල තීරන් ගත්ත සභාපතිවරයෙක්. එතුමාට දීර්ඝායුෂ පතමින් මම නිහඩවෙනවා.

<u>ගරු මන්ත්‍රී නීල් ද ඩග්ලස් සමරකෝන් මහතා (එ.ජා.ප.)</u>

ගරු සභාපතිතුමනි, මම මුලින්ම හිටපු සභාපති සනී ජයවර්ධන මැතිතුමාට  සුභාශිංසනය පුදරකනවා. හැමදාමත් අපේ රාජු බුත්පිටිය මන්ත්‍රීතුමා මේ සභාවේ මන්ත්‍රීවරු හැසිරුනු විදිහ දක්කහම කියනවා කවදාවත් සනී ජයවර්ධන සභාපතිතුමා ඉන්නැද්දී මෙහෙම හැසිරෙන්න දුන්නේ නැහැ. මේ මන්ත්‍රීවරුන්ගේ විනය තදින්ම ආරක්ෂා කරපු කෙනෙක් කියා තදින්ම කියනවා. මමත්  සභාවේ මන්ත්‍රීවරයෙක් නොවෙයි ප්‍රාදේශීය සභාවට ඇවිත් ගිය කෙනෙක් හැටියට ප්‍රශ්න කතා කරන්න ආවහම හොඳින්ම සවන් දුන්න සභාපතිවරයෙක් හැටියට මමත් එතුමා කියපු කතා ඔක්කොම පිලිගන්නවා.  එතුමා අද නැගිටලා ලොකු කතාවක් කිවුවා.
නමුත් මට ප්‍රශ්නයක් හිතට ආවා එතුමා කියන්න ගියදේ කිවුවේ නැද්ද කියලා.එතුමා කියන්න ගියේ රට වඩා ලොකු දෙයක් බව මම විශ්වාස කරනවා.
1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතින් සංස්ථාපනය වූ ප්‍රාදේශීය සභාව දොම්පෙ ආසනයේ වැඩිම කාලයක් පාලනය කළේ ශ්‍රීලංකා නිදහස් පක්ෂයයි. වර්තමානයේ ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ අනුරූපය වන පොහොට්ටුව පාලනය කරනවා තමයි නමුත් මේ ප්‍රාදේශීය සභාව වැඩිම කාලයක් පාලනය කළේ ඔබතුමන්ලයි.
ඔබතුමාලා පාලනය කළ මේ කාල පරිච්ඡේදය දෙස බැලුවිට සනී ජයවර්ධන මැතිතුමාට සංතෝෂවෙන්න යම්යම් දේවල් තිබෙනවා. මේ ගොඩනැගිල්ලේ අපි අද ඉන්නේ එතුමා ආරම්භ කළ වැඩසටහන් නිසයි.අපේ උභය කුමාර ජයවර්ධන මැතිතුමාගේ කාලයේ එතුමාට සතුටුවෙන්න ගොඩක් දේවල් තිබුණා. මේ සභාවට වටිනා යම්  යම් උපකරණ ගත්තා අදත් ඒවා වටිනා දේවල්. කලා අසපු වගේ දේවල්.ඒවා සිහිවටන. ඒවගේ සතුටු වියහැකි දේවල් නිර්මාණය කළ නායකයින් දෙන්නෙක්. රට පසු අපි 2011 ප්‍රාදේශීය සභාවට මුල්වරට ආපුවහම අපිත් එක්ක තරග කළ කෙනෙක් තමයි ප්‍රාදේශීය සභාවේ සභාපති ලෙස වැඩ භාරගත්තේ. ඉන් පසු ප්‍රාදේශීය සභාව කියන්නේ මෙවැනි ආයතනයක්ද ඇයි අපි මෙයට ආවේ කියන හැඟීමත් ආවා. නිර්මාණශීලි කිසිම දෙයෙක් එහි තිබුනේ නැහැ අනාගතය වෙනුවෙන් ඔහුගේ දේශපාලන ජීවිතය වෙනුවෙන් යම්යම් වැඩකරන එකක් පමණයි.මේ සභාවේ ධනය විවිධ විදිහට අවභාවිතා කරනවා අපි දැක්කා. කළයුතු දේවල් මේ සභාවේ අනුමැතියෙන් තොරව අපි කතා කරනවා නමුත් ඒගැන විවේචනය කරනවා .ඒවා ගණන් නොගෙන මුදල් අවභාවිතා වන විදිහට කටයුතු කළා කියන හැඟීමක් අපිට තිබුණා. නමුත් අපිට කරන්න දෙයක් තිබුනේ නැහැ. එදා සිට මේ සභාවේ වැඩි බලයක් තිබුනේ ඔබතුමන්ලට නිසා. ඒ විදිහටයි ගෙන ගියේ. දීර්ඝ කාලයක් මේ ප්‍රාදේශීය සභාව ආරම්භ වෙලා. නමුත් දොම්පෙ සංවර්ධනය දෙස බැලුවිට ඔබතුමන්ලා ප්‍රාදේශීය සභාවේ නායකයෝ හැටියට කණගාටු වියයුතුයි කියා මම සිතනවා. අද මේ සභාවේ මුදල් වැයකර මාර්ග හදලා තිබෙනවා. ඒ මාර්ගවල කිසිම ප්‍රමිතියක් තිබෙනවාද, විදිපහන්වල කිසිම ප්‍රමිතියක් නැහැ. කරන්න තිබෙන ව්‍යාපෘති කෙරලි නැහැ. පසුගිය කාලයේ විශාල කොටසක් වැඩ ආරම්භකර බෝඩ් ගැහුවා. අද ඒ මාර්ගවල කටයුතු කෙරෙන්නේ නැහැ. ජනතාවගේ පැතුම් ඉටුවී නැහැ. මේ ප්‍රාදේශීය සභාව අපිට නොවුනත් අපේ අණ්ඩුව තියන කාලේ අපි ව්‍යාපාති රැසක් කළා. මේ ඉස්සරහ තිබෙන බස්ටැන්ඩ් එක ලස්සනට හැදුවා. අද එය නඩත්තුවෙන්නෑ. රථවාහන ගාල සභාවට නිර්මාණය කර දුන්නාට අද ඒවා නඩත්තු වෙන්නෑ. ව්‍යායාම මධ්‍යස්ථානය හදලා දුන්නට එහි ලස්සනක් දකින්න නැහැ. ඔබතුමාලා පොළක් හැදුවා . හැදුයයුතු තැන නොවෙයි හැදුවේ. මුළු භූමියම අවහිරවෙලා එයින්. පොළේ කිසිම පිරිසිදුභාවයක්ද නැහැ. ඔබතුමාලා සිටි දීර්ඝ පාලන කාලය තුල සතුටුවියහැකි දේවල් තිබෙන්නේ ඉතා සීමිතවයි.
ප්‍රාදේශීය සභාව හරියට පන්සලක මිදුල වගේ තිබිය යුතුයි. තව කෙනෙකුට ආකර්ශනීය වියයුතුයි. ජනතාවට අපි හොඳ ආදර්ශයක් වියයුතුයි.
අපේ ගම්වල කඨින පින්කම් තිබෙනවා. විදිපහන් හදාගෙන යනවා. නමුත් හැදෙන්නේ නැති ඒවත් තිබෙනවා. මේසභාවට කතාකර අදාල මන්ත්‍රීවරුන්ටත් කතාකර නොකෙරන විට අපි ඒ සේවකයින්ට කියූ විට අපිට එන්න පෙට්‍රල් නැති බව කියනවා.

<u>ගරු සභාපතිතුමා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු මන්ත්‍රීතුමනි, කඨින පින්කම්වලට ඔබතුමා අපිට කිවුවානම් හදලා නැතිව ඉඳලා නැහැ. පෙට්‍රල් නැහැ කියා අපි හදලා නැතිව ඉඳලා නැහැ.

ගරු මන්ත්‍රී නීල් ද ඩග්ලස් සමරකෝන් මහතා (එ.ජා.ප.)

ඔබතුමාට යමත් කිවුවොත් කෙරනවා. නමුත් අදාල කොට්ඨාශවල මන්ත්‍රීවරන්ට අපි කතාකර කියා තිබෙනවා. නමුත් හැදෙන්නේ නැහැ. එවිට අපහසුතාවට පත්වෙන්නේ මේ සභාව. ඊළග මැතිවරණයකට අපි සුදානම් වෙනවා. ඔය කියන කතන්දර එක්ක ප්‍රාදේශිය සභා මැතිවරණය තියයි කියා මම හිතන්නේ නැහැ. ප්‍රාදේශිය සභා මැතිවරණය කොමසාරිස් අතට යයි. රටපසු මහ මැතිවරණයකට යයි. අපි ඉදිරි ප්‍රාදේශිය සභා මැතිවරණයකට සුදානම් වෙන්නත් ඕනෑ. ඔබතුමාලා නම් එහෙම සුදානම් වීමක් නැහැ. අපි කරපු ව්‍යාපෘති අතරමග නැවතී තිබෙනවා. මේරිලන්ඩ් ග්‍රාම සේවා වසමේ අපි ජල ව්‍යාපෘතියක් ආරම්භ කළා. ඔබතුමාලගේ ආණ්ඩුව යටතේ එහි වතුර ටික දිගන්න බැරිව තිබෙනවා.ඒ ජනතාව අද වතුර ටික ගන්නේ බලහත්කාරයෙන් ගෙවල් කිපයක් විතරක්. මෙවැනි වාතාවරණයක් තුල ඔබතුමාලාට ඉදිරියේදී ගමට ගිහින් නම් කතා කරන්න බැරි වෙයි. කොසු ඉදල් ලෑස්ති කරගෙන බලා ඉන්නවා ඔබතුමන්ලා එනකම් කියා ප්‍රකාශ කරමින් මම නිහඩවෙනවා.

ගරු මන්ත්‍රී ඩබ්.එල්.ඥානවතී මිය (ශ්‍ර.පො.පෙ.)

ගරු සභාපතිතුමනි, සනි ජයවර්ධන මැතතුමා කියපු දේවල් ගැන මට ආඩම්බරයක් ඇති වුනා. අපි දෙන්නා තමයි ඒ කාලයේ දොම්පෙ ප්‍රදේශය පුරාම දේශපාලන කටයුතුවලට ගියේ. සිරිමාවෝ මැතිනියත් එක්කත් මම ලංකාව පුරාම දේශපාලන කටයුතුවලට ගියා. මේ කටයුතුවලදී එ.ජා.ප. අය මට නොයෙක් කතා හැදුවා . නමුත් දේශපාලන ජීවිතය මට බොහෝම නම්බුකාර විදිහට ගත කළා. ඒ ගැන සනි ජයවර්ධන මැතිතුමා දන්නවා. එහෙම දේශපාලනය කරලා අවුරුදු 80 ක් වෙනකොට මන්ත්‍රී ධුරයක් ලැබුනේ මගේ පෙර පිනකට. මේ එන ඔක්තෝම්බර් 27 සාහිත්‍ය උත්සවය දවසේ තමයි මගේ 80 වෙනි උපන් දිනය. අවුරුදු 59 ක් මම දේශපාලනය කළා. ඒ ගැන සිතලා මට සතුටුටවන්න පුලුවන්.  මගේ අතින් වරදක් වුනානම් වචනයකින් හරි ඒ සියලු දේ වෙනුවෙන් සමාව දෙන්න 80 වන ජන්ම දිනයට සංතෝෂයෙන් ජීවත්වෙන්න ලැබෙන්න කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඩවෙනවා.

ගරු මන්ත්‍රී එස්.ඒ.ඩී.වික්‍රමරත්න මිය (එ.ජා.ප.)

ගරු සභාපතිතුමනි, මටත් දැන් වයස අවුරුදු 77 ක් විතර.මමත් එතුමියලා එක්ක සනි ජයවර්ධන මහතා අපි කට්ටිය එකට ගිය ගමනක්.නමුත් මට මැතිවරණයකට ඉදිරිපත්වෙන්න අවස්ථාව ලැබුනේ ගාමිනී දිසානායක මහතාට හා ලලිත් ඇතුලත්මුදලි මහතාට පිංසිද්දවෙන්නයි. 1997 ප්‍රාදේශිය සභාවට තරග කරලා තුන්වෙනි තැනට මම ආවා. මම මෙතුමත් එක්ක සංතෝෂයෙන් එදා මේ සභාවේ වැඩ කළා.  හැම අවුරුද්දෙම සභාවෙන් දෙන දිනපොතට අමතරව මෙතුමා මට කාඅතේ හරි වෙනම දිනපොතක් එවනවා. මම විතරයි එදා කාන්තාවක් හැටියට හිටියේ. එතුමාට ආශිර්වාද කරනවා,මම සුභාශිංසනය ගරු කරනවා.

ගරු මන්ත්‍රී සාලින්ද දේශප්‍රිය මහතා (ශ්‍රී.පො.පෙ.)

ගරු සභාපතිතුමනි, මම අපේ සනි ජයවර්ධන මැතිතුමාටත්, මේ මන්ත්‍රීතුමියන් දෙපලටත් සුභාසංශනය පලකරනවා. නිදුක් නිරෝගී සුවය ප්‍රාර්ථනා කරනවා.
අපි සභාවක් විදිහට පක්ෂ විපක්ෂ සියලුදෙනාම එකට ඉන්නවා සභාව ඇතුලේ. එළියෙත් එකට මේ සමාජ සුභසාධන සිද්දි සිදුවෙනවානම් අපිට මීට එහා දෙයක් කරගන්න පුලුවන් හොඳයි.

තිඹිරිගහකන්ද මාර්ගය පවුල් කීපයක්ම ගමන් කරනවා. අත්‍යාවශ්‍යම මාර්ගයක් හදන්න ඕනෑ. මෙය පොඩියට කරන්න පුලුවන් වැඩක් නෙවෙයි කියා මම දන්නවා. අපි මෙයට ආරම්භයක් හෝ ගනිමු. පවුල් 5 ක් විතර ඉන්නවා. අන්ධ පවුලක් ඉන්නවා. අපි මේ වනවිට ගෙයක් හදලා දුන්නා. ඒවගේ දුප්පත් පවුලක් ඉන්නවා. ඒ පාර් මිනියක්වත් ගෙනියන්න බැහැ. දොම්පෙ ආසනයේ තිබෙන  පුංචි ගම්මානය තිබෙන එකම තැන වෙන්න ඇති. ඒ ගැනත් අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මට පොඩි දනගැනීමක් අවශ්‍යයි. මෙහි ව්‍යාපෘති කරලා නැති එකේ තිබෙනවා, කිරිදිවැල මහජන ක්‍රිඩාංගනය සකස් කිරීම කියා. මීට පෙරත් අපට ක්‍රීඩාපිටිය සකස් කරන්න කියා මුදල් ආවා. නමුත් අපි කිසි කෙනෙකුට ප්‍රයෝජනයක් නැති ව්‍යාපෘතියක් තමයි මෙහි සිද්ධ වුනේ. මේ සභාවේ සියලු මුදල් ටික දැමුවත් ඒ කාණු පද්ධතිය බැඳලා ඉවර කරන්න බැහැ. එය සංශෝධනය කරලා වැසිකිලි පද්ධති ටික හරි නවීකරණය කරලා දෙන්න. නැතිනම් ඒවත් ජරාජීර්ණවෙලා යනවා.
අවුරුදු ගානක ඉදන් කරන ඉල්ලීමක් තිබෙනවා. මාලිගාවත්ත ක්‍රීඩාපිටිය ක්‍රිකට් ක්‍රීඩාවටත් එල්ලේ ක්‍රීඩාවටත් වැඩ ජනප්‍රියතාවයක් තිබෙනවා. සියනෑ ක්‍රීඩා සමාජයත් කිරිදිවැල මධ්‍ය මහා විද්‍යාලයේ දරුවොත් ක්‍රීඩාකරන එකම තැන තමයි මෙතන. ක්‍රීඩිපිටිය දෙපැත්තේ දර්ශන තල දෙකක අවශ්‍යතාවය තිබෙනවා. එය ක්‍රිකට් ක්‍රීඩාවට අවශම දෙයක්.මමක්‍රිකට් ක්‍රීඩාවට සම්බන්ධ නිසාම ඒ අවශ්‍යතාවය ඉටුකරන දෙන ලෙස ඉල්ලීම්  මම ලගටත් ආවා.ඒනිසා දර්ශන තල දෙක ලබාදෙන්න. ක්‍රීඩාපිටියට කිසි හානියක් වෙන්නේ නැහැ. වෙනත් තරගයක් හරි සංගීත සංදර්ශනයක් තියනකොට තල්ලු කරලා ඒක අයින් කරන්න පුලුවන්. ඒනිසා ඒකෙන් බාදාවක් අවහිරයක් වෙන්නේ නැහැ.

ඒවාගේම සැමදාම මත්ද්‍රව්‍ය ගැන කතා රකනවා. දන සැම ගමකම මේවා පැතිරිලා. නව තාක්ෂණය දරුවන්ගේ අතට ලැබුනම මනස විකෘතිවෙලා තිබෙනවා. ඒ කාලේ මේ දේවල් තිබුනේ නැහැ. 7,8 වසරේ පොඩ දරුවෝ පවා දන් පරිහානියට පත්වෙලා ඉන්නේ. මේවාට මොකක් හෝ විකල්පයක් සභාවක් හැටියට අපි ගත්තේ නැතිනම් අනාගතයත් නැතිවෙන්න පුලුවන්. දන් දවස් 3 ට කලින් බයිසිකලේ යන කෙනාව වට්ටලා පර්ස් එක අරගෙන සල්ලි අරගෙන ඔක්කොම අරන් ගිහින්. මංකොල්ල කාලා අරගෙන ගිහින් කුඩුගහන තත්වයට පත්වෙලා. මෙනිසා දන් බවභෝගයක් පවා තියාගන්න බැහැ.
දහම්පාසල් ටික ඉහලට ගත්තානම් හරි මේ දේවල් මගහරවා ගන්න. අඩු ගානෙ ඔබතුමා පොලිසියේ OIC ගෙන්වලා කමිටු දාගෙන මත්ද්‍රව්‍ය උවදුර නැති කරන්න කටයුතු කරානම් හොඳයි.
රාත්‍රී කාලයේ නිකරුනේ තරුණ පරම්පරාව පාරේ ගැවෙසනවා. ස්ථානාධිපතිවරු දැනුවත්කර මෙයටත් පියවර ගතයුතුයි. මේ දවස්වල සමුපකාර ෂෙඩ් එකේ පොම්පයත් කැඩිලා තෙල් නැති ප්‍රශ්නයත් තිබෙනවා. මාර්ග කම්කරු අයට තෙල් ලබාගැනීමේ ගැටලුවක් තිබෙනවා කියා මට දනගන්න ලැබුණා. ඒ වෙනුවෙන් වෙන ෂෙඩ් එකකින් හරි ලබාගෙන අවශ්‍ය කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා.මේ දවස්වල හැම පන්සලකම වගේ කඨින පින්කම් කෙරෙනවා. විදුලි පහන් කඩා වැටී තිබෙනවා. ඒවත් පිළිසකර කරනවානම හොඳයි. මේ පින්කම් දවස්වල අපේ කම්කරුවෝ ටික එක තැනකට ඒ සඳහා සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කරනවානම් හොඳයි. දෛනිකව වැඩකරන කණ්ඩායමට මේ කඩාගෙන නැමිලා තිබෙන විදුලි පහන් හදන්න කාලයක් නැහැ. එක දවසකට එක මන්ත්‍රීවරයෙක්ගේ ලයිට් 30,40 ක් විතර හදන්න තිබෙනවා. ඒ ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

<u>ගරු මන්ත්‍රී රාජා ලක්ෂ්මන් මහතා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු සභාපතිතුමනි, අපේ සනී ජයවර්ධන මැතිතමාගෙගේ ඉදිරි දේශපාලන ගමන සාර්ථක වෙන්න කියා මම ප්‍රාර්ථනා කරනවා. මගේ කොට්ඨාශයේ මේරිලන්ඩ් ජනපදයේ හැරෙන්න අනිත් සියලු විදුලි පහන් ක්‍රියාත්මක වෙනවා. මගේ වසම් දෙකකට කාපට් පාරවල් දෙකක් ආවා. ඒත් දන් ඒවා අතරමග නැතවිලා. මේරිලන්ඩ් ජනපදය හා මහර කොට්ඨාශය යාවන ස්ථානයේ පාර කාපට් කරන්න තටයුතු කරමින් ඉන්න අතරතුරදී තමයි නැති වුනේ. දන් යාමට ඉතා අපහසු තත්වයක් තිබෙනවා. ඒ ස්ථානය ගැන අවධානය යොමුකරලා එය පිළිසකර කරදෙන්න කටයුතු කරන්න කියා ඉල්ලනවා.
කිරිඳිවැල නගරයේ බස්නැවතුම්පල ගත්තොත් එහි උඩ තට්ටුව මිහිපිට අපායක් වගෙයි. ඔබතුමාට පුලුවන්නම් අද හරි බස්ටෑන්ඩ් එක උඩට නැගලා බලන්න . ගම්පහ දිස්ත්‍රික්කයෙන් මිහිපිට අපාය බලාගන්න පුලුවන් වෙයි. අපචාර සිද්දිත් වෙනවා. මම ඩිපෝව ලක්ෂ 18 ක් ලාභ ලබනකොට අපිට මේ ලයිට් ටිකවත් දාලා දීලා බිල ගෙවලා දෙන්න කියලා කිව්වා. ඩිපෝ කළමණාකරු ඒවා ඇහුවේ නැහැ. ග්‍රාමීය මාර්ග ටිකේ බස් ටික දාලා දෙන්න කිව්වත් එතුමා ඒවා ක්‍රියාශීලව කලේ නැහැ. පාසල් ළමයෙකුට තියා අපිටවත් උඩට නැග්ගහම බලන්න බැරි දේවල් තිබෙනවා. දන් මෙය ගණිකා වෘත්තියේ නියැලෙන ස්ථානයක් වගේ හැදිලා තිබෙන්නේ. රාත්‍රියේ බස්ටෑන්ඩ් එකේ මුර සංචාරයත්වත් දාන්න කියා මම කිරිඳිවැල පොලිසියේ OIC මහත්තයටත් කිව්වා. තව ටික දවසක් යනකොට වැසිකලි යන්නත් කිරිඳිවැල බස්ටෑන්ඩ් එක පාවච්චි කරයි. ඒ ගැන ගරු සභාපතිතුමනි විශේෂ අවධානය යොමු කරන්න.
ඔබතුමා පුගොඩ උසාවිය නියෝජනය කරන නීතිඥවරයෙක් හැටියට කිවයුතුයි මේ මනුස්සයෙක් අයිස් මත්ද්‍රව්‍ය පාවිච්චි කළොත් පුගොඩ උසාවියෙන් දඩ ගහන්නේ රු.2000 යි. කසිප්පු බෝතලයක් ළඟ තියාගෙන සිටියොත් රු.10000 ක් දඩ ගහනවා. මෙය තමයි රටේ නීතිය. අපි කොහොමද රටක් හදන්නේ ඉතින්. වතුරුගමත් දන් පාසල් අවට මේ මත්ද්‍රව්‍ය භාවිතය පැතිර තිබෙනවා. තදබල දඩුවමක් දුන්නානම් ඒකෙන් වැලකෙනවා. නීතියට ගරුකරන සභාපතිවරයෙක් හැටියට ඒ ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිනවා.

<u>ගරු මන්ත්‍රී දිමුතු ප්‍රදීප් පල්ලෙවෙල මහතා (ජ.වි.පෙ.)</u>

ගරු සභාපතිතුමනි, ගිය සභාවෙදී සියනෑ පාසලේ ක්‍රීඩාපිටිය පරිහරණය සම්බන්ධයෙන් ගැටලුවක් මතු වුනා. මේ වෙනකම් නිරාකරණය වෙලා නැහැ. තරුණ ඉල්ලීමක් විදිහට තිබෙනවා. එයට මැදිහත්වෙලා කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා.
අද දවසේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් මන්ත්‍රීතුමියන් අදහස් දැක්වුවා. අපි ප්‍රාදේශිය සභාවේ ඉගෙන ගත්තේ උපතේ සිට මරණය දක්වා මේ චපසරිය තුල ප්‍රජාව වෙනුවෙන් කටයුතු කරන්න අපි බැඳී සිටිනවා. මේ රටේ ආර්ථික ප්‍රශ්නෙත් එක්ක සභාවට යම් වියදම් සීමාවකට යන්න වෙලා තිබෙනවා. අපි ඒක වෙනුවන්ම උරණ වෙනවද කියා අපි මතු කරනවා. කනතු සම්බන්ධයෙන් මුදල් කමිටු නිර්දේශයක් ඇවිත් තිබුනා කනතු කම්බි ගහලා සීමා මායිම් දැම්මට. ඩග්ලස් මන්ත්‍රීතුමත් මේ සම්බන්ධව කිව්වා. විනිවිදභාවය පිළිබඳ ගැටලු මතු වුනා. අපි අවුරුදු ගානක් සභාවේ ඉඳලා ඊට එහා විසඳුම් අපිට නැද්ද, දැන් මේ වෙනකොට මැද්දේගම ප්‍රදේශයේ බිම්සවියෙන් මනිනවා. එහෙම ව්‍යාපෘතියක් රජය හරහා අරගෙන අපේ සභාවට අයිති ටික අපි ප්ලෑන් එකකින් අනුමත කරගනිමු. අපි කම්බි ගහලා අවුරුදු 2,3 ක් යනවිට ආයි එය අබලන්. මේනිසා අපේ ප්‍රජවගේ අරමුදල්ම නාස්තිවෙනවා. ආදාහනාගරය නිසා කනත්ත පරිහරණය වෙන්නෑ. මීට වඩා සභාවට අලංකාරය ගෙන දෙන ස්වභාවික පරිසරයට ගැලපෙන ව්‍යාපෘතිවලට යම. අයවැයේ හෝ අපි එවැනි යෝජනා අරගෙන ක්‍රියාත්මක කරමු. හිටපු සභාපතිතුමා කියනවා කොන්ක්‍රීට් පාරවලුත් කැඩිලලු.
ඒ සම්බන්ධයෙනුත් ඔබතුමා අවධානය යොමු කරන්න. සුසානභූමි සම්බන්ධයෙන් අපි ගත් තීරණය හොඳ ප්ලෑන් එකක් තියාගෙන අපි ඒකට අදාලව ඉහත සඳහන් කරන කාරණයකට යමු.
විදිපහන් ගැන සභාවට ආ දා සිට මේ කාරණය මතන් කරනවා. මේ රටේ ඩොලර් නැතිව ආර්ථික ප්‍රශ්නයත් එක්ක අපි විදුලි අර්බුදේ ඉන්නවා. කඨින කාලයෙත් අපිට යන්න වෙන්නේ ටෝච් එකත් අරගෙන කරන්ට් එක කපනවා. විදිපහන් හැදුවත් ඒ අවස්ථාවට අදාලව පාවිච්චි වෙන්න බැරි වෙයි. මේවාට විකල්ප සෙවිය යුතුයි. මත්ද්‍රව්‍ය භාවිතයත් එක්ක සොරසකුරෝ වැඩිවෙලා තිබෙනවා. කරන්ට් එක කපනවත් එක්ක ගෙවල්වලට බහිනවා.

අපි පාරට දාන ලයිට් එකේ උපයෝගිතාවය තිබෙන්නේ පහල. ලයිට් සඳහා විශාල මුදලක් අපි වියදම් කළාට එහි උපයෝගීතාවය හීනවෙලා තිබෙනවා. අපි එයට වියදම් කරන දේ සමාජයට ප්‍රතිලාභය වැඩිවන දේ තෝරමු කියා යෝජනා කරනවා.
අපි සභාවේ විපක්ෂය හැටියට මතුකළ යුතුදේ සාලින්ද මන්ත්‍රීතුමාලා මතක් කරනවා. මත්ද්‍රව්‍ය ගැන අපි සාලින්ද මන්ත්‍රීතුමාලා මතක් කරනවා. නමුත් දැන් මෙය භයහතර නොතේරෙන ළමයා දක්වා ගිහින්. දෙමාපියෝ දරුවෝ ගැන සොයා නොබැලීමේ විපාකයයි අද මේ භුක්ති විදින්නේ. මේ කුඩුගෙන්වන සියලු ජාලයම මේ සමාජය ගිලගෙන ඉවරයි. අපේ පවුල ඇතුලේ මේ තරුණ ප්‍රජාව බේරාගතයුතුයි. අපි පාසැල් මට්ටමින් ගිහින් දෙමාපියන් සමග කතා කළයුතුයි. ඒ සඳහාත් සභාව විදිහට මැදිහත්වෙන්න පුලුවන්නම් ඒ තැනට අපි යමු. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු සභාවේ යම් නිහැඩියාවක් දෝ අලුත් පරපුරට ඉදිරියට යන්න දී ඔවුන් නිහඬවෙනවාදෝ යන හැගීමක් මට සභාව ඇතුලේ දැනුනා. අළුත් පරපුරත් එක්ක මේ රට ගොඩනැගිය යුතුයි අවුරුදු 74 ක් දේශපාලනය තුල ඇවිත් අපි රටක් විදිහට ඉන්නේ ඛේදනීය තැනක.ඒ එදා ගුරුවරයා විදිහට ඒ ලස්සන රට අපට ගොඩනගන්න ඕනෑ. එයට අපි ජාතික ජනබල වේගය විදිහට මේ රටේ ඉන්න සියළු ප්‍රජාව මුලුගන්වමින් තරුණ ප්‍රජාව විද්වත් ඒ සියළුදෙනාම එකතුකර ගනිමින් ගමනක් යනවා. ඒ වෙනුවෙන් පොදුවේ සියළු ෙ දනාටත් ආරාධනා කරමින් මම නිහඬවෙනවා.

<u>ගරු විපක්ෂනායක උභය කුමාර ජයවර්ධන මහතා (එ.ජා.ප.)</u>

ගරු සභාපතිතුමනි, අද වැදගත් දේවල් ගොඩක් මේ සභාවේදී කතා කළා. අද සනී මැතිතුමා කළ කතාව මොන හේතුවකට කළාද කියා ඒක අපිට ප්‍රශ්නයක්. නමුත් ඒ කතාවෙන් ගන්න දේවල් සෑහෙන්න තිබෙනවා. එතුමා ගුරුවරයෙක් මගේ. එතුමා යටතේ තමයි අපි මේ ප්‍රාදේශීය සභාවේ වැඩ කටයුතු කළේ. අඩු සම්පත් ප්‍රමාණයක් හා අඩු සේවකයන් පිරිසක් එක්කයි එතුමා වැඩ කළේ. එතුමාගේ ප්‍රකාශයත් එක්ක අපිට අද මේ රටෙ දේශපාලනයට වෙලා තිබෙන්නේ මොකද කියා අපිට පේනවා. ගෝඨාභය ජනාධිපතිගේ සම්ප්‍රාප්තියත් එක්ක තමයි අද මේ දේ රටට වුනේ. ගෝඨභය මහත්තයට චිත්‍ර ඇදගන්න බැරි වුනේ අහසේ විතරයි. අරගලය නිසා ඒකත් කරන්න බැරි වුනා. දෙසැම්බර් වෙන්න කලින් මහින්ද රාජපක්ෂව අගමැති කරන්න තමයි යන්නේ. දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඉල්ලා අස්වෙනවා. අප්‍රියෙල් මාසය වනවිට ජාත්‍යන්තර අධිකරණයක් හරහා ඒ 06 දෙනාම රිමාන්ඩ් කරනවා මහින්ද රාජපක්ෂ බැසිල් රාජපක්ෂ ගෝඨාභය රාජපක්ෂ මහ බැංකු අධිපති වෙලා හිටිය කබ්රාල්ව . ලබන අප්‍රියෙල් වනවිට මොකක් හරි මැතිවරණයක් තියයි.
අද කොච්චර පිරිහිලා තිබෙනවද කිවුවොත් මේ දොම්පෙ ආසනයේ මහා විද්‍යාලයක ගැහැණු ළමයි Whats App Group එකක් හදාගෙන තමන්ගේ නිරුවත් ඡායාරූප හුවමාරු කරගෙන තිබෙනවා. මේවා ගැන කවුරුවත් කතා කරනනේ නැහැ. ඒ සිද්ධිය යට ගහලා දමුවා. මේ ගෑණු ළමයි සම ලිංගික පැත්තට යොමුවෙලා තිබෙනවා. අධ්‍යාපන අධ්‍යක්ෂක කැඳවලා අහන්න .විදුහල්පතිවරු කැඳවලා අහන්න. එහෙම නැහැ කියනවානම් මම කියන්නම් කරපු තැනයි ඉස්කෝලෙයි දෙකම. සමහර බාලිකා විද්‍යාලවල මේවා තමයි ඇත්ත කතාව. අද ළමුන් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවෙලා බීලා යනවා ඉස්කෝලේ. බෝක්කු පාලම් ගැන කතා කළාට අපි බලන්න ඕනෑ සමාජයට මොකද වෙලා තිබෙන්නේ කියලා. අද ප්‍රගති සමාලෝචන රැස්වීම නෑ කතා කරන්න. සම්බන්ධීකරණ රැස්වීම තියනවා කිවුවට 4 දෙනෙක් එකතුවෙලා ඒක තියනවා. අද අයිස් මත්ද්‍රව්‍ය පාවිච්චි කරලා සමහර ළමයි එල්ලිලා මැරෙනවා. ඒවා ගැන අපි ගන්න තීරණය මොකක්ද, පොලිසිය තියනවා,උසාවිය තිබෙනවා. උසාවියට දාපුවහම ඇප දෙනවා. ආයි එළියට ඇවිත් කුඩු ගහනවා. ක්‍රමවත් වැඩ පිලිවෙලක් නැහැ. මේකට. හරිනම් OIC ලා 3,4 දෙනා ගෙන්වලා මේ මන්ත්‍රීවරු ගෙන්වලා මේවට විසඳුම් සොයන්න ඕනෑ. අද අහිංසක මිනිහෙකුට හරකෙක් හදාගන්න නැහැ.දිගටම හරක් හොරකම් කරනවා. අද පොලිසිය කරන්නේ කියලා අපිට තේරෙන්නේ නැහැ මේවා හදන්න කියලනේ භාරදුන්නේ. දන කාලයක් කෑ ගැහුවා පෙළපාලි ගියා. වනාළුවාවේ ගල කඩනවා කියලා ඊයේ බෝර දාලා ගල කඩන්න. අර මහා අලියා ගල මොකක්ද මේ නීතිය.

<u>ගරු සභාපතිතුමා (ශ්‍රී.පො.පෙ.)</u>
ගරු විපක්ෂනායකතුමනි, ගල කඩන්න කියලා ජනාධිපතිතුමාගේ විශේෂ අවසරයක් දීලා තිබෙනවා.

<u>ගරු විපක්ෂනායක උභය කුමාර ජයවර්ධන මහතා (එ.ජා.ප.)</u>

ගරු සභාපතිතුමනි, මම ඒ ගැන දන්නෑ. මිලාන් මන්ත්‍රීතුමා ඉන්න කාලේ බොහොම අමාරුවෙන් ඕක නවත්වගෙන සිටියේ. මේක මෙහෙම කරන්න බැහැ. දන් මාලිගාවත්තේ තිබෙනවා ඉඩම් ටිකක්. මම ඔබතුමාටත් ඒ ගැන කතා කළා.මේවා ප්‍රාදේශීය සභාවේ ඉඩම්. ප්‍රාදේශීය සභාවට LRC දීපු ඉඩම. මේ ඉඩම ඇයි ප්‍රාදේශීය සභාවේ අපි ගන්නේ නැත්තේ. මේ ඉඩම හාමුදුරු නමකට දුන්නා. ඒ හාමුදුරුවන්ගේ පිරිවෙන හදන්න කියලා. ඒක දුන්නේ ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ ඇමතිතුමයි. රාජිත සේනාරත්න ඇමතිතුමයි ඒ කාලේ අපිට එපා කියද්දී හාමුදුරුවන්ට ඒක එපා කියලා අන්තමට LRC එක කරලා තිබෙන්නේ මොකක්ද, ඒක මිනිස්සුන්ට විකුණලා. කම්බි ගහලා ඒක නැවැත්වුවට ඒකේ අවසානය මොකක්ද, මම කියන්නේ මේක අයිති ප්‍රාදේශීය සභාවට බලයක් තිබෙනවානම් ඇයි මිනිස්සුන්ට නටන්න දෙන්නේ. මන්ත්‍රීවරු වන අපිට තමයි බලය තිබෙන්නේ. සභා තීරණයක් අරගෙන කටයුතු කරන්න. බලය දීලා තිබෙන්නේ ප්‍රාදේශීය සභාවට. ආයි කාටවත් කම්බි ගහන්න කනු හිටවන්න බෑ. මේකට ඉඩ දෙනන එපා. මට ආරංචියි මේවා ගෙවල් හදන්න යනවා කියලා. අපි ඔතන හදන්න හිටියේ සම්මන්ත්‍රණ ශාලාවක්. අඩුගානේ මහජනයට කිරිඳිවැල හෝල් එක හදන්න. එතන ඉඩමක තමා හාමුදුරුවන්ට දුන්නේ. අතන නාමල් උයන ගාව ඉඩමයි වතුර ටැංකිය ගාව ඉඩමයි.මේවා පිලික්ස් ඩයස් බණ්ඩාරනායක මැතිතුමාගේ කාලයේ අරන් දම්මේ. රාජකරුණා ඇමතිතුමා ඇති කලේ ජනතාවට . අද එක එක දේශපාලකයෝ කලින් කරපු දේවල් දන්නේ නැතිව ඇවිත් මෙවා විනාශ කරනවා .මේ ගැන ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිනවා.

අපි ඉල්ලීම කළා හැමදාම මේ ගැන කතා කරනවා ඉන්දික මන්ත්‍රීතුමත් කිවුවා අර අවිස්සාවේල්ලෙන් පුගොඩට එන බස් 3 නාගස්හංදිය වෙනකම් දික්කරන්න කියලා. තවම මේකට තීරණයක් නැහැ. මම හිටයානම් මේ දොම්පෙ ආසනයේ මොන නිලදාරියෙක්ටවත් පගා ගහන්න වංචා කරන්න දෙන්නේබනැහැ. මම හිටියානම් ඔය DS ට විරුද්ධව පියවර ගන්නවා. ගම්පහ දිස්ත්‍රික්කයේ රාජ්‍ය ආදායමෙන් 40% ආදායමට එන්නේ. 60% ක් යන්නේ නිලධාරින්ගේ සාක්කුවලට. අද බාර් පරමිට දෙන්න යනවා ලක්ෂ 30,40 අත යට ගන්නවා. පොඩි තැන ඉදන් ඉහල තැනට යනබම්ම වංචාව. ඩෙංගු බලන්න එන නිලදාරියා පගාව ගන්නවා. අද ළමයින්ට ස්කූල් වෑන් එකක යන්නත් බැහැ. බඩු මිල වැඩියි. බේත් ටික නැහැ. ඔපරේෂන් කරන්නේ නැහැ. අද මහරගම පිලිකා රෝගලේ  විශාල ප්‍රමාණයක් දෛනිකව මැරෙනවා. අද වෙනකොට 60% ක් විතරම සමෘද්දිය කැපෙනවා මම මේ මන්ත්‍රීතුමාගෙනුත් ඇහුවා තියන මිනිහාගනේ සමෘද්ධිය කැපුවට කමක් නැහැ එතකොට නැති මිනිහට මොකද වෙන්නේ. ඔබතුමා කිවුවා නාගරික සංවර්ධන අධිකාරියට යැවුවා කියලා. ඒවා යන්න ඕන ප්‍රේමදාස ජනාධිපතිතුමා ප්‍රාදේශීය සභාවල් හැදුවේ ජනතාවට සේවය සලසන්න. නමුත් සේවයක් වෙන්නේ නැහැ. දුප්පත් මනුස්සයෙක් ගණන් ගන්නේ නැහැ. ඉඩම් වෙන්දේසිකරන අයට නීතිය හරියට ක්‍රියාත්මක කරන්න. ඕනෑ. 1% බද්ද හරියට ක්‍රියාත්මක කරන්නේ කවුද, අපිට ආදායම නැත්තේ ඒකයි. දැන් OIC ලා එවනවා හැම පැත්තෙන්ම. ඒ ගොල්ලන්ට වැඩ කරන්න දෙන්නේ නැහැ. මේනිසා අපේ රට හැදෙන්නේ නැත්තේ. 23 වෙනිදා සාහිත්‍ය උත්සවය තිබෙනවා. මම ඒකට ආරාධනා කරනවා ආරාධනා පත්‍රයක් එයි. අපේ ආසනේ මහගමසේකර මැතිතුමාගේ ඉඳන් ලේඛකයෝ 170 ක් විතර ඉන්නවා. ඒ සේරම එකට එකතුකරලා කලා සංගමයක් හදලා මියගිය අයටත් පිං පමුනුවනවා ප.ව.3 ට විතර. එතන ශද්ධ කරලා දෙන්න කියලා මම සභාපතිතුමාගෙනුත් ඉල්ලීමක් කළා. කොඩි කණුත් සවිකරලා දෙන්න කියලා ඉල්ලීමක්ද කළා. එතන දේශපාලනයක් නැහැ. ලබන 27 වෙනිදා දොම්පෙ ආසනේ ඉන්න උසස්පොළ පාස් වුනු සියල්දෙනා එක තැනකට කැඳවනවා.උගන්වපු ගුරුවරුත් දෙමාපියොත් කැඳවලා අධ්‍යාපනය වෙනුවෙන් දවැන්ත උත්සවයක් කරන්න සුදානම් කරනවා. සියලු දේ කරන්න සුදානම් කරනවා.හරිදේ කරන්න සියලු දෙනාටම ආරාධනා කරමින්  මම නිහඬවෙනවා.

<u>ගරු සභාපතිතුමා (ශ්‍රී.පො.පෙ.)</u>

ගරු මන්ත්‍රීවරුනි,ගරුමන්ත්‍රීතුමියනි, අද සභාවේ දීර්ඝ වශයෙන් හැමදාම කතාකරන පොදු ප්‍රශ්න ටික කත කෙරුණා. කාපට් පාරවල් සංවර්ධනය කිරීම බරපතල ප්‍රශ්නයක්. අතරමග නැවතී තිබෙනවා. මෙය දොම්පෙ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විතරක් නොවෙයි මුළු ලංකාවෙම තිබෙන ප්‍රශ්නයක්. මෙයට රජයෙන් කුමන හෝ වැඩ පිලිවෙලක් යොදනකම් අපිට තනියෙන් කරදෙන්න හැකි මට්ටමක් නැහැ.

ප්‍රාදේශීය සභාවේ භාණ්ඩ මිලදී ගැනීම් මන්ත්‍රීවරුන්ගේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම් මම නැවත  වරක් අදාල නිලධාරින් කැඳවලා  කඩිනම් කරන්න පියවර ගන්නවා.

එරතාපකන්ද මාර්ගයේ ප්‍රශ්නය පද්මිණී මන්ත්‍රීතුමිය සඳහන් කළා. එය පැහැදිලිව් තිබෙන ප්‍රශ්නයක්. මම එය ස්ථානයට ගිහිනුත් බැලුවා. විශාල මුදලක් ඒ සඳහා වැයවනවා. පාර කැඩිලා පැතිබැම්මක් එක්ක යායුතුයි.එයත් මේ වර්ෂයේ කුමන හෝ ප්‍රතිපාදනයක් යොදා ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තුවෙනවා.

ගස් කැපීඹ ගැන කිවුවා. අපේ ආසනයේ දැව අඹරන කර්මාන්ත ශාලා දෙක්ක තිබෙනවා.  ගස්වලට අමතරව කුඩා කැලෑ සියල්ල කපලා කිලෝ ගානට ගෙනියනවා. පිංගමුවේ ගෙවල් ළගත් දැන් එකක් පටන් ගන්න යනවා. පරිසර අධිකාරියෙන් තමන්ගේ ගෙදර කොස් ගහ කපා ගත්තොත් රටේ තිබෙන නීති දානවා. තමන්ගේ ගෙදර ගහ කපාගන්න එක එක නිලධාරියා පස්සේ යායුතුයි. නමුත් මේවා කරන්න  කොහෙන්වත් බාධාවක් නැහැ.225 ම වැරදි කිය කියා ඉන්නවා. මේ නිලධාරි කරන වැඩ ගැන කවුරුවත් කතා කරන්නෑ. මේ සියල්ලටම ඉහල නිලධාරින් විගකිවයුතුයි.  මේ නිලධාරින්ට විරුද්දව ජනරැල්ල එනකම් මෙය  නිවැරදි වෙන්නෑ.

ෂරත් ගාමිණී මන්ත්‍රීතුමා  අපේ සාහිත්‍ය උත්සවය ගැන කතා කළා. ඒ සඳහා සියළුදෙනාටම ආරාධනා කරනවා.

එළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රශ්නය මම අවස්ථා කීපයකම පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියට කතා කළා. එහෙ තිබෙන්නෙත් කම්කරු ප්‍රශ්නය. 8 පාස් අය දාලා තිබෙන්නේ මහත්වරු හැටයට. මෙය හරි ගැටළුවක්. 30000තර බඳවා ගත්තා මෙහාට උද්‍යාන අජංකරු කියලා එවලා තිබුණා. මම ගම්පහට කතාකර මෙහෙ මල්වත්තක් නැහැ ඒ අය එපා තිවුවා.  තනතුරු ගහලා එවන හැටි. ඒ මිනිස්සු පළාත්පද මාර් සංවර්ධන අධිකාරියටත් දාලා. ඒ මිනිස්සු  ඉලුක් කපන්නෑ. ඉස්සර දෛනික පදනමට බඳවාග! අය ඉලුක් කපනවා. දැන් ඒ අය බඳවා ගන්න දෙන්නෙත් නැහැ අර කට්ටයගෙන් වැඩ ගන්න කියනවා.  මේවා තමයි නිලධාරි කරන වැඩ. මේනිසා ආණ්ඩු පෙරලෙනවා.

වාලුගම සණස පාර ගැන කතා කළා. මමත් ඒ ස්ථානයේ වැ ඉවර වෙනකම් ඉඳලයි ආවේ. එහි ඉතිරි වැඩ ටික නවාත නැහැ ඒ ටිකත් කරනවා.

ව්‍රියන්ත දීපාල් මන්ත්‍රීතුමාගේ මාර්ගයත් සකස් කරමින් යනවා.

ෂාලින්ද මන්ත්‍රීතුමා මත්ද්‍රව්‍ය ඇතුළු ක්‍රීඩා පිළිබඳව කරුණු ගණනාවක් සඳහන් කළා. මාලිගාවත්ත  ක්‍රීඩාංගනයේ වෙන්කරපු මුදලින් අවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු කරගෙන යනවා.

පෙට්‍රල් ප්‍රශ්නය ගැන කතා කළා. පෙට්‍රල් ප්‍රශ්නය නිසාම ලයිට් හදන්නේ නැතිව ඉන්නෑ. කෙසේ හෝ තෙල්  සපයාගෙන කරගෙන යනවා. ප්‍රාදේශීය සභාවේ දැන් තිබෙන ෂල්ලි ටික වියදම් වන්නේ නඩත්තු සඳහායි. ඉස්සර මාසෙට රු.85000,90000 ක් ගිය ප්‍රාදේශීය සභාවේ දැන් ෂතියකට රු.150000 ක් විතර යනවා. මේකයි ත්තවය. අපිට ලැබෙන ආදායම් නඩත්තුවලට ගියහම අපිට මේක කරගෙන යන්න බැහැ.  විදිලාම්පු  ප්‍රශ්නයත් තදින්ම බලපා තිබෙනවා. රු.1200,1300 තිබු විදිපහන් මෙවර අඩුම මිලගණන් ඇවිත් තිබෙන්නේ රු.4000 ට. බල්බ් එකම රු.900,1000 ක් වෙනවා. වයර් මීටර් 20 කට යනවා රු.1500 ක් විතර. දැන් රු.ලක්ෂයකින් විදිපහන් 20 ක් ගේන්නත් බැහැ. නමුත් ආදායම වැඩිවුනේ නැහැ. ආදායම එන්න එන්නම අඩුවෙනවා. ගිය අවුරුද්දේ මුද්දර ආදායම් කෝටි 9 ක් බජට්කර තිබුණා. තව ඇවිත් තිබෙන්නේ කෝටි 3 යි. ඉතිරි ටික එන්නේ නැහැ.හිටු සභාපතිතුමාලා කතා කළා.  ඉස්සර ආසනේ විදිපහන් 250,300 කි තිබෙන්න ඇති.  දැන් වැකේ පේරුවෙම් විදිපහන් 6000 ක් විතර තිබෙනවා.  එක්කකෙනයි හදන්න ඉන්නේ තිබෙන්නේ එක ත්‍රීවිල් එකයි.

ඉස්සර ප්‍රාදේශීය සභාවට පාරේ තිබෙන ඉලුක් කපන්න කියා කිවුවේ නැහැ. ගෙවල් ළග ශුද්ද කරගත්තා. දැන් තමන්ගේ ගේට්ටුව ළග තිබෙන ගහ කපන්නේ නැහැ. මිනිස්සු කුඹුරේ කඩාවුව කැඩුනහමත් කතා කරන්නේ ප්‍රාදේශීය සභාවට. පාරේ බල්ලෙක් මැරුනු විට පාරට ගෙනත් දානවා. කෙහෙල් ගහ කපලා කොටය දානවා පාරට. එහෙම සමාජයක් එක්ක මේ වැඩ කරන්න අමාරුයි.
හොරකම නවත්වන් කියා අරගලකරුවන් ඉල්ලනවා. කවුරුවත් මෙන්න මේ සංවර්ධනය කරන්න ඕනෑ. මේවා නිපදවන්න ඕනෑ, අපි කැප කරන්න ඕනෑ, අපි ලැස්තියෙි මේවා කරන්න කියා කවුරුවත් කිවුවද, 71 කැරැල්ල තිබුණා. ඒ කැරැල්ලෙදී ජනතාව සිටියේ ආණ්ඩුවත් එක්ක. පොලිසිය රැක්කෙ මිනිස්සු ජ.වි.පෙ. න් ගහන එක වලක්වන්න. 88 භීෂණ කාලයේ ජනතාව සිටියේ ආණ්ඩුවත් එක්ක. ඔත්තු දුන්නා.ජ.වි.පෙ. ඔක්කොම අල්ලලා දුන්නේ ගමේ මිනිස්සු. ජනතාව හිටියේ ආණ්ඩුවත් එක්ක. මේපාර ජනතාව ආණ්ඩුවත් එක්ක හිටියි නැහැ. ජනතාව කැරැල්ල එක්ක හිටිටය් ,ප්‍රයෝජනය ගත්තේ නැහැ. ගෝඨා පැන්නුවා. දැන් ගහන කෙනෙක් ගෙනත් තියාගත්තා. එච්චරයි කළේ.
සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් ඒකාලේ කළ බව අපේ ඩග්ලස් මන්ත්‍රීතුවා කිවුවා.බස්ටෑන්ඩ් එක කළා ඉවර කළේ නැහැ. මේ බස්ටෑන්ඩ් එකේ කඩ ටික යාලුවන්ට හරි දීලා දැමුවා නම් අද ඒ ප්‍රශ්නය නැහැ. කළා හරියට කළේ නැහැ.
දොම්පෙ සියනෑ පාසල පිළිබඳව අපේ දිමුතු ප්‍රදීප් මන්ත්‍රීතුමා කතා කළා. හාමුදුරුවෝ දැඩි තීරණයක ඉන්නවා. අපා ආපහු පෞද්ගලිකව පන්සලට හෝ ගිහින් කතාකර මේ ප්‍රශ්නය විසදා ගමු.
ජයකොඩි සෙනවිරත්න මහත්තයා අභවප්‍රාප්ත වුනා. එතුමාගේ අභාවය පිළිබඳව දොම්පෙ ප්‍රාදේශීය සභාවේ බලවත් ශෝකය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. මත්ද්‍රව්‍ය ගැන ශාන්ත මන්ත්‍රීතුමා ඇතුලු ඔක්කොම ගැන කතා කළා. අද පොලිසියට මත්ද්‍රව්‍ය ගැන ඔත්තුවක් දුන්විට පොලිසිය රහස් එළි කරනවා. අද අපරාධ වැඩිවෙලා තිබෙන්නේ පොලිසිය නිසා.ගමක කසිප්පු පොලවල් දෙක තුනක් ඇති. පොලිසිය ඔතනට වෙලා එක සුමානයක් කැරකි කැරකි සිටියොත් නවත්වනවා. කරන්නෑ. කොහෙන් හරි ෂල්ලි ටිකක් අරගෙන යනවා.මේ රටේ පොලිසිය හරි පාරේ යනකම් මේ අපරාධ නවත්වන්න බැහැ අපි කොච්චර කතා කළත්. අයිස් මත්ද්‍රව්‍ය වල දඩ ගැන කතා කිවුවා. ගංජාවලට රු.3500 යි අරක්කු බෝතලයට රු.5000 යි. රා බෝතලයට රු.7500 යි රා බොන එක කසිප්පු බොන එකට වඩා වරදක්.
පුනරුස්ථාපනය කරන්න අපිත් අධිකරණයෙන් ඉල්ලා තිබෙනවා.නමුත් අවසර දෙන්නේ නැහැ. ඇබ්බැහිවුනා කියා තීන්දු කරන්න නඩු 3 කට වඩා වැඩිය තිබිය යුතුයි. පුනරුස්ථාපනය කරන්න නඩු 3 කට ඩැඩිය තිබී තුන් වතාවකට වඩා දඩ ගෙවා තිබිය යුතුයි. මේවා මේ රටේ නිලධාරි හදලා තිබෙන දේවල්. මේවා ගැන පාර්ලමේන්තුවේ කතා කළත් වැඩක් නැහැ. අද මෙය මේ රටේ තිබෙන බරපතල ප්‍රශ්නයක්. හැමෝම වැරදි කළෙත් කියන්න කෙනෙක් ඉන්නවා පාලනය කරන්න කෙනෙක් ඉන්නවා. අධිකරණය වැරදි කළොත් කෙනෙක් නැහැ. ව්‍යවස්ථාදායකය තමයි නීති හදන්නේ. එතන කතා කරන්නත් බැහැ. එතන මිනිස්සු තමන්ගේ බලතල අඩු කරගෙන තිබෙනවා. මන්ත්‍රීවරු මේ රටේ දේශපලඥයෝ පිළිබඳ ජනතා විශ්වාසය නැති වෙනකම් මේ රට හදන්න බැහැ. එය නැති කරන්නේ ආණ්ඩු පක්ෂයයි විපක්ෂයයි. දෙගොල්ලන්ට දෙගොල්ලන් හොරා කියා ගන්නවා. ජනතාවට පාලකයෝ ගැන විශ්වාසයක් ගොඩනැගිය යුතුයි ඒ අය කියන දේ පිළිගන්න.තමන්ට ඊළඟ ඡන්දය දිනීම සඳහා පමණක් කටයුතු කරනවා විනා පැවැත්ම ගැන කටයුතු කරන්නේ නැහැ.

පුගොඩ බස් එක මණ්ඩාවල දක්වා දික්කරන එක ගැන අපි ලිඛිතව දැනුම් දුන්නා. ලියුම් ගහන ඒවා කෙරෙනවානම් මේ රටේ ප්‍රශ්න මෙලහට ඔක්කමො විසඳිලා. කිරිඳිවැල ඩිපෝවේ විපක්ෂනායකතුමා කියපුවා ක්‍රියාත්මක කරන්න පුලුවන්නම් මම ෂතියකට ඔබතුමාට භාරදෙනවා. මමත් කැමතියා ඔබතුමා කියපුවාට. නමුත් මට නම් කරගන්න බැහැ. පුලුවන්නම් භාරගන්න.

ඉඩම් වෙන්දේසිය ගැන විපක්ෂනායකතුමා කතා කළා. අතීතයේ 1% බද්ද ගත්හැටියි දැන් ගන්න හැටියි පොඩ්ඩක් හොයලා බබලන්න. ඉස්සර 1% බද්ද කිවුවේ පර්චස් එකට රු.10000,12000,15000. දැන් හැම එකක්ම ලක්ෂ එකහ මාර දෙක. අලුත්ම වෙන්දේසි බලන්න 1% බද්ද අපි ලක්ෂ 30,40 අරගෙන තිබෙනවා. බජට් කළේ පැරණි විදිහට . 1% බද්ද අපි බජට් කළා වගේ දෙගුණයක් අරගෙන තිබෙනවා. ඒවා හරියට කෙරිලා තිබෙනවා. ඒවායේ අඩුපාඩුවක් තිබෙනවානම් නැවත පෙන්වන්න. නිවැරදි කරන්න උත්සාහ කරනවා. නමුත් කීපයක් වෙන්දේසිකර තිබෙනවා එකක්වත් අනුමත කර නැහැ. ඒවා කෑලි 5, 6 ඉඩම්. නමුත් ප්‍රධාන වෙන්දේසිවල එකක්වත් නියම ප්‍රමිතීන් නැතිනම් අනුමත කර නැහැ. ඔබතුමා කියු ඒවා සියයට සීයම ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. ඒවායේ ඇත්තත් තිබෙනවා.අවසාන වශයෙන් අද දින සභා රැස්වීම සාර්ථකව පවත්වාගෙන යාමට සහයදුන් සියළුදෙනාටම මගේ ස්තුතිය පුද කරමින් සභා රැස්වීමේ කටයුතු මෙයින් අවසන් කරනු ලබනවා.

2022.10.13 දින
දොම්පෙ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය
කිරිඳිවැල.

සභාපති
දොම්පෙ ප්‍රාදේශීය සභාව.